# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## இலங்கை மரமுந்திரிகை கூட்டுத்தாபனம்

## SRI LANKA CASHEW CORPORATION

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த கணக்கும் அறிக்கையும்

**ANNUAL REPORT AND ACCOUNTS**

**2013**

| පටුන | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිවරයාගේ වාර්තාව<br>• සංස්ථාවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ පරමාර්ථ<br>• අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි හැඳින්වීම | 01-21 |
| 2. | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 22-26 |
| 3. | විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 27-29 |
| 4 | කාර්ය සාධන වාර්තාව | 30-34 |
| 5. | කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපෙක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග | 35-42 |
| 6. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 43-55 |
| 7. | 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 56-67 |
| 8. | විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග | 68-75 |
| 9 | වර්ෂ 5 ක ගිණුම් සාරාංශය | 76 |

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2013 වර්ෂය සඳහා සභාපතිගේ වාර්තාව

(01). <u>ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25වන දින අංක 60/7 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියළුම සෙවාවන් සැපයීම සිදුකරන අතරතුර වාණිජ කටයුතුද ලාභදායි මට්ටමකින් සිදුකරයි.

- **දැක්ම**

ඉතාමත් උසස් තත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුලින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

- **මෙහෙවර**

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පර්ශවයන් වෙත වෘත්තියමය මග පෙන්වීම ලබාදීම තුලින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ලඟාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නගාසිටුවීම.

## ඉලක්ක

- වගාව ව්‍යාප්ත කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළඳනාමයක් ඇතිකිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය
- කජු අපනයනය දිරිගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්වීම.
- ලාභ ඉපයීම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

## අරමුණු

(අ). කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ). කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඇ). කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ තාක්ෂණික. අළෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඈ). කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඉ). කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(ඊ). කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(උ). කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අළෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.

(ඌ). කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

(02). <u>ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය -2013</u>

(2.1) **2013.01.01 දින සිට 2013.09.21 දින දක්වා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| i). | **සනත් වීරකෝන් මහතා** | - | **සභාපති** |
| ii). | එස්.කේ.ගුණපාල මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii). | එම්.ඩී.අබේගුණවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත |
| iv). | ඩබ්.වී.වී.ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v). | ඩබ්.පී.ඥාණසිරි මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi). | එච්.ගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii). | සී.ජේ.අන්ද්‍රාදි මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

(2.2) 2013.09.21 දින සිට පත්වූ සංස්ථා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

| | | | |
|---|---|---|---|
| i). | **සනත් වීරකෝන් මහතා** | - | **සභාපති** |
| ii). | එච්.අයි.ගුණවර්ධන මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii). | එම්.ඩී.අබේගුණවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත |
| iv). | යූ.සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v). | එල්.කුරේ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi). | ඒ.එම්.අම්බ්‍රාස් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii). | කේ.විදානපතිරණ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

2013 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - වී.යූ.ලියනගේ මහතා

(2.3) **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කලමනාකරණ කමිටුව** -2013

| | | | |
|---|---|---|---|
| i) | ඩබ්.වී.වී.ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සභාපති 2013.08.13 දින දක්වා) |
| ii). | එම්.ඩී.අබේගුණවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත (කමිටු සාමාජික 2013.01.29 දින සිට) |
| iii). | එච්.අයි.ගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික2013.08.13 දින දක්වා) |
| iv). | සී.ජේ.අන්ද්‍රාදි මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික 2013.04.30 දින දක්වා) |
| v). | ඩී.කේ.ජයකොඩිආරච්චි මහතා | - | කමිටු සාමාජික - සාමාන්‍යාධිකාරී |
| vi). | එම්.ටී.එස්.කේ.පීරිස් මහතා | - | කමිටු සාමාජික - කළමනාකාර මුදල් |
| vii). | එස්.ආර්.ප්‍රනාන්දු මහත්මිය | - | කමිටු සාමාජික (2013.08.13දින සිට) වැඩ බලන කළමනාකාර - පාලන |
| viii). | වී.යූ. ලියනගේ මහතා | - | කමිටු ලේකම්- අභ්‍යන්තර විගණක |
| ix). | ඒ.පී.පී.අතුකෝරළ මහත්මිය | - | කමිටු නිරීක්ෂක - විගණන අධිකාරී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත |

## (2.4) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහල කළමනාකරණය

i). ඩී.කේ.ජයකොඩිආරච්චි මහතා - සාමාන්‍යාධිකාරී

## (2.5) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| i). | එස්.එස්.බී.රත්නායක මහතා | - | කළමනාකරු වතු/ වැඩ බලන කළමනාකරු ප්‍රතිපත්ති හා සැලසුම් |
| ii). | එම්.ටී.එස්.කේ.පීරිස් මහතා | - | කළමනාකරු -මූල්‍ය |
| iii). | ජී.බී.බී.සුරේන්ද්‍ර මහතා | - | කළමනාකරු- ව්‍යාප්ති |
| iv). | වී.යූ.ලියනගේ මහතා | - | අභ්‍යන්තර විගණක - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| v). | එස්.ආර්.ප්‍රනාන්දු මහත්මිය | - | වැඩ බලන කළමනාකරු - පාලන |
| vi). | ආර්.එම්.පී.ජයතිස්ස මහතා | - | වැඩ බලන කළමනාකරු - අලෙවි හා පිරිසැකසුම් |

## (2.6) <u>ලියාපදිංචි කාර්යාල</u>

**ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල**

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය

**දුරකථන**

| | | |
|---|---|---|
| සභාපති | - | 0112-871005 |
| නියෝජ්‍ය සභාපති | - | 0112-869844 |
| සාමාන්‍යාධිකාරී | - | 0112-876134 |
| **ෆැක්ස්** | - | 0112-867843 |
| **ඊ මේල්** | - | cashewco@dialogsl.net |
| **වෙබ් අඩවිය** | - | www.cashew.lk |

**(2.7) ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක**

| | ප්‍රාදේශීය කාර්යාල | | ආවරණය වන දිස්ත්‍රික්ක |
|---|---|---|---|
| 1. | පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය | - | පුත්තලම/කුරුණෑගල |
| 2. | හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය | - | හම්බන්තොට/රත්නපුර |
| 3. | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | - | අනුරාධපුරය/වව්නියා/ මන්නාරම/මුලතිව් |
| 4. | නාඋල ප්‍රාදේශීය කාර්යාලය | - | මාතලේ/ පොළොන්නරුව |
| 5. | මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය | - | මොණරාගල |
| 6. | මහියංගණය ප්‍රාදේශීය කාර්යාලය | - | මහනුවර/බදුල්ල |
| 7. | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | - | අම්පාර |
| 8. | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | - | මඩකලපුව |
| 9. | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය | - | ත්‍රිකුණාමලය |
| 10. | කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය | - | කිලිනොච්චි/මුලතිව්/යාපනය |

(2.8)

| | වතුයායන් | | පිහිටි දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 1. | කමන්දළුව වතුයාය | - | පුත්තලම |
| 2. | පුත්තලම ආච්චිගෙවත්ත වතුයාය | - | පුත්තලම |
| 3. | එළුවන්කුලම වතුයාය | - | පුත්තලම |
| 4. | හාඩි වතුයාය | - | මඩකලපුව |
| 5. | මාන්කර්ණි වතුයාය | - | මඩකලපුව |
| 6. | කොණ්ඩච්චි වතුයාය | - | මන්නාරම - (සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ සංවර්ධනය කෙරේ) |
| 7. | පුනරීන් වතුයාය | - | කිලිනොච්චි-(යුධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලැබේ) |
| 8. | මඩු වතුයාය | - | මන්නාරම - ක්‍රියාත්මක නොවේ. |
| 9. | ඔයාමඩුව වතුයාය | - | අනුරාධපුරය |

(2.9)

| | ශාක අභිජනන මධ්‍යස්ථාන | | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 1. | විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | - | අනුරාධපුරය |
| 2. | නාලන්ද ශාක අභිජනන මධ්‍යස්ථානය | - | මාතලේ |
| 3. | මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය | - | අම්පාර |
| 4. | සුදුවතුර ආර ශාක අභිජනන මධ්‍යස්ථානය | - | මොණරාගල |

(2.10) <u>මධ්‍යම පැළ තවාන්</u> <u>ආවරණය වන දිස්ත්‍රික්ක</u>

| | | | |
|---|---|---|---|
| 1. | මිහින්තලේ පැළ තවාන | - | අනුරාධපුර, වව්නියා, මන්නාරම, කිලිනොච්චි, මුලතිව් |
| 2. | දඹුල්ල පැළ තවාන | - | මාතලේ, පොළොන්නරුව |
| 3. | කමන්දළුව පැළ තවාන | - | පුත්තලම, කුරුණෑගල |
| 4. | හාඩි පැළ තවාන | - | මඩකලපුව/ත්‍රිකුණාමලය |
| 5. | කුඹුක්කන පැළ තවාන | - | මොණරාගල |
| 6. | අළුත්තරම පැළ තවාන | - | බදුල්ල/මහනුවර |
| 7. | චන්ද්‍රිකාවැව පැළ තවාන | - | හම්බන්තොට/රත්නපුර |

(2.11) <u>කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | | |
|---|---|---|---|
| 1. | නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | - | ගම්පහ |
| 2. | පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය | - | පුත්තලම |

(2.12) <u>පර්යේෂණ ඒකක</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | | |
|---|---|---|---|
| 1. | කමන්දළුව පර්යේෂණ ඒකකය | - | පුත්තලම |
| 2. | පුත්තලම පර්යේෂණ ඒකකය | - | පුත්තලම |

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය** වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිළි කලමනාකරණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සංස්ථාව හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

(2.13) <u>සංස්ථා කජු අලෙවිසැල්</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | | |
|---|---|---|---|
| 1. | අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය | - | කොළඹ |
| 2 | අංක 518, ගාළු පාර, කොළඹ 03 | - | කොළඹ |

(2.14) **සංස්ථා වරලත් කජු අලෙවිසැල් පිහිටා ඇති ස්ථාන**

1. රන්දිය පෘට්ස් ඇන්ඩ් නට්ස්, පයාගල, මග්ගොන
2. ෂරෝමා රෙස්ට් ඇන්ඩ් බේකර්ස්, අංක 60, ගාළු පාර, බලපිටිය
3. සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ
4. P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල
5. ප්‍රෙෂ් ෆාම් ෂොප්, ගාළු පාර, හික්කඩුව
6. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට
7. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, රාගම පාර, වැලිසර
8. Ranjanas 7 Stories, අංක 318, ගාළු පාර, කොලඹ 04
9. ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඟුරුවාතොට පාර, හොරණ
10. පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සෙවා සමුපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර
11. නිව් ඇමරිකන් චිකන් හට්, 16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර

(2.15) **සංචාරක බංගලා** **දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| 1. | පුත්තලම සංචාරක බංගලාව | - | පුත්තලම |
| 2. | හාඩි සංචාරක බංගලාව | - | මඩකලපුව |

(03). **සංස්ථාවේ සංවර්ධන කාර්යයන්**


ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කරයි.

**වැඩසටහන්**

1. **ව්‍යාප්ති සහනාධාර වැඩසටහන**
2. **වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**
3. **අළෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**
4. **පර්යේෂණ සහ සංවර්ධනය**
5. **'දිවි නැගුම' 'දැයට කිරුළ' සහ අනෙකුත් සංවර්ධන**

## (3.1) ව්‍යාප්ති සහනාධාර වැඩසටහන

### (3.1.1) ශ්‍රී ලංකාවේ කජු වගාවේ සංයුතිය




| | | |
|---|---|---|
| * දි.ආ.ව.ඒ | - | 'දිවි නැගුම' ආර්ථික වගා ඒකක |
| දි.ආ.දි.ප්‍ර.න | - | දිලිදු ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීමේ හා ප්‍රජාව නගා සිටුවීමේ ව්‍යාපෘතිය |
| ප්‍රා.ආ.ස.වැ | - | ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන-මාතලේ දිස්ත්‍රික්කය |
| උ.ගැ.පු.දෙ | - | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ව්‍යාපෘතිය |

### (3.1.2) කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

#### (3.1.2.1) වගා වපසරිය වැඩිකිරීම

ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත සමස්ත කජු වගා භූමි ප්‍රමාණය අක්කර 119054 කි. 2013 වර්ෂයේදී දිස්ත්‍රික්ක 18 ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 125 ක් ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 2500 ක් හා බීජ කජු අක්කර 1750 ක් වගා කරන ලදී. ඒ යටතේ ප්‍රතිලාභී පවුල් 2545 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

**කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය**

| දිස්ත්‍රික්කය | බද්ධ කජු (අක්කර) | බීජ කජු (අක්කර) |
|---|---|---|
| 1. පුත්තලම | 500 | - |
| 2. කුරුණෑගල | 450 | - |
| 3. හම්බන්තොට | 275 | - |
| 4. අනුරාධපුරය | 400 | - |
| 5. අම්පාර | - | 400 |
| 6. බදුල්ල | 125 | - |
| 7. මහනුවර | 25 | - |
| 8. රත්නපුර | 25 | - |
| 9. මාතලේ | 150 | - |
| 10. පොළොන්නරුව | 150 | - |
| 11. මොණරාගල | 300 | - |
| 12. මඩකලපුව | 50 | 450 |
| 13. ත්‍රිකුණාමලය | 50 | 350 |
| 14. වවුනියා | - | 100 |
| 15. මන්නාරම | - | 100 |
| 16. මුලතිව් | - | 150 |
| 17. කිලිනොච්චි | - | 150 |
| 18. යාපනය | - | 50 |
| **එකතුව** | 2500 | 1750 |

(3.1.2.2) **ගොවීන්හට සහනාධාර ගෙවීම් සිදුකිරීම**

හම්බන්තොට, පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව, මාතලේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, රත්නපුර, වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කවල සහනාධාර යෝජනා ක්‍රමය යටතේ කජු වගාකල ගොවි පවුල් 1977 ක් වෙත රු.මිලියන 3.4 ක මුදලක් ගෙවීමට හැකිවිය. බද්ධ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු.9,500/- ක් සහ බද්ධ කජු වගාව සඳහා යෝග්‍ය නොවන ප්‍රදේශවල බීජ කජු වගාකිරීම අක්කරයකට රු.3,500/- ක සහනාධාරයක් ගෙවනු ලැබේ.

### (3.1.2.3) ව්‍යාප්ති සේවා පුළුල් කිරීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වගා කටයුතු ආවරණය කිරීම සඳහා ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයද, උතුරු පළාතේ කිලිනොච්චි, මුලතිව් හා යාපනය දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලයද පිහිටුවීමට කටයුතු කරන ලදී.

විශේෂයෙන්ම කිලිනොච්චි, යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල කජු වගා සහනාධාර වැඩසටහන යටතේ අක්කර 350 ක් ප්‍රතිලාභී පවුල් 300කගේ සහභාගීත්වයෙන් අළුතෙන් වගා කරන ලදී.

## (3.2) වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම

### (3.2.1) කජු වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

### (3.2.1.1) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

සංස්ථාවේ ශාක අභිජනන මධ්‍යස්ථානවල ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ මිලියන 1.1 ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ හා මව්ගස් වලින් ලබාගත් රිකිළි 300000 ක ප්‍රමාණයක් භාවිතා කරන ලදී.

| ශාක අභිජනන මධ්‍යස්ථානය | දිස්ත්‍රික්කය | භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 1.විලච්චිය | අනුරාධපුරය | 25 |
| 2.නාලන්ද | මාතලේ | 75 |
| 3.මහඔය | අම්පාර | 81 |
| 4.සුදුවතුර ආර | මොණරාගල | 50 |
| එකතුව | | 231 |

## (3.2.2.2) තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් වලින් ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේද වලින් සමන්විත බද්ධ පැළ 468714 ක් නිෂ්පදනය කර, 'දිවි නැගුම' හා සහනාධාර වැඩසටහන සඳහා නිකුත් කරන ලදී.

2013 වර්ෂයේ බද්ධ පැළ නිෂ්පාදනය

| පැළ තවානේ නම | නිපදවන ලද බද්ධ පැළ |
|---|---|
| 1.කමන්දළුව | 200341 |
| 2.දඹුල්ල | 60964 |
| 3.මිහින්තලේ | 62312 |
| 4.අළුත්තරම | 45320 |
| 5.කුඹුක්කන | 42787 |
| 6.හාඩි | 16265 |
| 7.චන්ද්‍රිකා වැව | 40725 |
| **එකතුව** | 468714 |

සහනාධාර යෝජනා ක්‍රමයට අවශ්‍ය බීජ පැළ 88529 ක් නිපදවීම සඳහා මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියා, මන්නාරම, මුලතිව්, කිළිනොච්චි, යාපනය හා අම්පාර දිස්ත්‍රික්කවල පැළ තවාන් 48 ක් ස්ථාපනය කරන ලදී.

## (3.2.2.3) වතුයායන්වල නව වගාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම, හාඩි, ඔයාමඩුව, මාන්කර්ණි, මඩකලපුව යන වතුයායන්වල විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකල අතර, අක්කර 660 ක පමණ නව වගාව සිදුකරන ලදී. මෙම වැඩසටහන් වලදී, විශෙෂයෙන්ම උතුරු පලාතේ පිහිටි කොණ්ඩච්චි වතුයායේ හා නැගෙනහිර පලාතේ පිහිටි මාන්කර්ණි වතුයාය සංවර්ධනය කිරිම සඳහා සිවිල්

ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාගන්නා ලදී. මෙම වගා කටයුතු සඳහා තාක්ෂණික සහයෝගිතාවය හා කජු පැළ, සංස්ථාව විසින් ලබාදෙන ලදී. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුනරීන් හි පිහිටි වතුයායන් ශ්‍රී ලංකා යුධ හමුදාව භාරයේ පවතින අතර එම වතුයායන්වල නඩත්තු කටයුතු සඳහා උපදේශාත්මක සෙවාවන් අඛණ්ඩව ලබාදෙන ලදී. මීට අමතරව සංස්ථාව සතු පරිණත කජු වගා අක්කර 2500 ක පමණ ප්‍රමාණයක වගා පුනරුත්ථාපන කටයුතු සිදුකරන ලද අතර, වතුයායන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් වන ට්‍රැක්ටර් සහ කෘෂි ආම්පන්න මිලදී ගන්නා ලදී.

### (3.2.2.4) ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් කුඩා කජු ඉඩම් හිමියන් සඳහා 'ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද (GAP) භාවිතයෙන් කජු වගාවේ ඵලදායිතාවය ඉහලට නැංවීම යන මැයෙන් වැඩසටහන් 08 ක් පවත්වන ලදී. මේ සඳහා පුත්තලම, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මුලතිව්, අනුරාධපුර යන දිස්ත්‍රික්කවල කුඩා කජු ඉඩම් හිමියන් 360 ක් සහභාගී විය. මීට අමතරව ගොවි පවුල් 2000 ක් සඳහා කජු වගාව, පලිබෝධ මර්ධනය, පොහොර භාවිතය, බද්ධ කිරීම යන මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් 86 ක් පවත්වා ඇත.

## (3.3) අලෙවි හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

### (3.3.1) පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය

### (3.3.1.1) ගොවීන්ගෙන් ලෙලිකජු මිලට ගැනීම

වෙළඳපොල තරඟකාරී තත්ත්වයන් යටතේ කජු ගොවීන්වෙත ලෙලිකජු කිලෝ ග්‍රෑම් 01 සඳහා රු 250/- ක් දක්වා මුදලක් ලැබෙන පරිදි ලෙලිකජු කිලෝග්‍රෑම් 27000 ක් සංස්ථාව විසින් මිලට ගන්නා ලදී. මෙනිසා තරඟකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය.

මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙට්‍රික් ටොන් 70.0 ක අස්වැන්නද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කරන ලදී.

### (3.3.1.2) කජු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහල මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කජු පිරිසැකසුම් කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කජු කැපීමේ යන්ත්‍ර ලබාදීම, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම් කරුවන් පුහුණු කිරීමත්, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම සිදුකරන ලදී. මේ සඳහා නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගන්නා ලදී.

### (3.3.2) කජු අතුරු නිෂ්පාදන සංවර්ධනය

### (3.3.2.1) කජු වයින් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම

සෑම කජු වාරයකදීම කජු පුහුලන් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අපතේයයි. මේ සඳහා සංස්ථාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණ කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ වයින් නිෂ්පාදනාගාරයක් ආරම්භ කරන ලදී. 2013 වර්ෂය අවසානයේදී මෙමගින් වයින් බෝතල් 4500 ක් නිෂ්පාදනය කල අතර, ඉදිරි වර්ෂ වලදී මෙහි නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම තුලින් අපතේ යන කජු පුහුලන් සඳහා වැඩි වටිනාකමක් ලබාදීමට කටයුතු කරනු ඇත. මෙම වයින් ඉතාම ඉහළ ප්‍රමිතියකින් යුතු වන අතර, ආනයනික වයින් වර්ග සමඟ තරඟ කල හැකි මට්ටමකින් නිෂ්පාදනය කර ඇත.

### (3.3.2.2) කජු පුහුලන් භාවිතයෙන් බීම නිපදවීම

ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් කජු පුහුලන් භාවිතකර පලතුරු බීම (Beverage) නිෂ්පාදනය සඳහා සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මේ පිළිබඳව විශෙෂ පුහුණු වැඩසටහනක් බ්‍රසීලයේදී පැවැත්වූ අතර 2014 වර්ෂයේ කජු අස්වැන්නත් සමඟ පර්යේෂණ මට්ටමින් බීම නිෂ්පාදනය ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

### (3.3.2.3) කජු පිරිසැකසුම් කිරීම හා අළෙවිකරණය

සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැඳගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් හා ගොවින්ගෙන් මිලදී ගන්නා ලද ලෙලිකජු පිරිසැකසුම් කර, අගය එකතු කරන ලද කජු මද කොල්ලුපිටිය හා රාජගිරියේ පිහිටි සංස්ථා අළෙවිසැල් උපයෝගි කරගෙන අළෙවිකරණ ලදී.

මීට අමතරව, අළෙවි ජාලය ශක්තිමත් කිරීම සඳහා හොරණ, බම්බලපිටිය, පානදුර, කළුතර, අම්බලන්ගොඩ, ගාල්ල, හික්කඩුව, මග්ගොන, නාරාහේන්පිට, වැලිසර හා බලපිටියේ පිහිටා ඇති වරලත් අලෙවිසැල් 11 ක් උපයෝගී කරගෙන අගය එකතු කරන ලද නව නිෂ්පාදන 06 ක් සහිත කජු නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත අලෙවි කරන ලදී. නව තාක්ෂණික ක්‍රම භාවිතය හා අගය එකතු කිරිම හා උසස් කජු නිෂ්පාදන අළෙවි කිරිම මගින් රු. මිලියන79.43 ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

### (3.3.2.4) කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම

වර්ෂ 2013 දී උසස් තත්ත්වයේ කජු මද හා අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 51 ක් ජාත්‍යාන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරිම මගින් රු. මිලියන 77 ක විදේශ විනිමය ඉපැයිමට ශ්‍රී ලංකාව සමත්විය. 2012 වර්ෂයේදී අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 146 ක් අපනයනය කිරීමෙන් රු.
මිලියන 170 ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත.

170 ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව අපනයන ධාරිතාවයේ හා විදේශ විනිමය ඉපැයීමේ අඩුවීමක් පෙන්නුම් කලද, සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර වර්ධනයත් සමඟ දේශීය වශයෙන් කජු මද සඳහා ඉල්ලුම ඉහළ යාමත්, ඒ අනුව දේශීය පරිභෝජනය ඉහළ යාම මෙයට හේතුවී ඇත. මීට අමතරව, අයහපත් කාලගුණික තත්ත්වයන් මත අපේක්ෂිත කජු අස්වැන්නේ අඩුවීමද මෙයට බලපා ඇත.

### (3.3.2.5) කජු ආනයනය

#### දේශීය පරිභෝජනය සඳහා ආනයනය

දේශීය වශයෙන් කජු පරිභෝජනය ඉහළ යාමත්, දේශගුණික විචල්‍යතා නිසා අපේක්ෂිත කජු අස්වැන්න අඩුවීම සමඟම කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලිකජු දේශීය වෙළඳපොලතුල හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලිකජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලිකජු මෙට්රික් ටොන් 160 ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් විසින් පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වල ජීවනෝපාය ස්ථාවර කිරීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි

### (3.4) පර්යේෂණ හා සංවර්ධනය

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ පලිබෝධ මර්ධනය, බද්ධ හා බීජ කජු වගාව, අස්වැන්න සහ අතුරුභෝග වගාව පිලිබඳ අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මගින් මෙම වැඩසටහන්වල ප්‍රගතිය

ඇගයීම සිදුකරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සේවා ජාලය මගින් උපදේශන සේවා ලබාදීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා, වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මගින් ගොවීන්වෙත ලබාදෙන ලදී.

## (3.5) 'දිවි නැගුම' 'දැයට කිරුළ' සහ අනෙකුත් සංවර්ධන වැඩසටහන්

### (3.5.1) 'දිවි නැගුම' ජාතික සංවර්ධන වැඩසටහන

මේ යටතේ දිස්ත්‍රික්ක 12 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 85ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් සඳහා බද්ධ පැළ 239588 නිෂ්පාදනය කර බෙදාදී රෝපණය කිරීමට කටයුතු කර ඇත.

### (3.5.2) 'දැයට කිරුළ' ජාතික සංවර්ධන වැඩසටහන (ජංගම සේවය)

මේ යටතේ කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්කවල ජංගම සේවා වැඩසටහන් 935 ක් සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නිලධාරීන් සහභාගී විය. මෙයින් ගැටළු 816 ක් සඳහා ගොවි මහතුන්හට විසඳුම් ලබාදෙන ලදී. කජු වගාව ආශ්‍රිත ගැටළු, පැළ ඇතුළුව සහනාධාර සේවා ලබාදීම, පළිබෝධ මර්ධනය, කජු පිරිසැකසුම් කර්මාන්තය, තත්ත්ව පාලනය, අගය එකතු කිරීම, අලෙවිය ආදී ගැටළු සඳහා විශෙෂයෙන් විසඳුම් ලබාදෙන ලදී.

### (3.5.3) 'දැයට කිරුළ' ජාතික ප්‍රදර්ශනය

'දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය පැවැත්වූ කාලසීමාවතුල සංස්ථාව විසින් සපයනු ලබන සේවාවන් සහ කජු නිෂ්පාදන ඇතුලත් අලෙවිසැලක් සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය තුල ඉදිරිපත් කරන ලදී.

**(04).** <u>අයවැය</u>

**(4.1)**

| වර්ගය | අරමුදල් ආයෝජනය - 2013 (රු. මිලියන) | | |
|---|---|---|---|
| | රාජ්‍ය ආයෝජන | උපයාගත් අරමුදල් | එකතුව |
| ප්‍රාග්ධන වියදම් | 48.67 | 36.38 | 85.05 |
| පුනරාවර්තන වියදම් | 52.50 | 9.21 | 61.71 |
| **එකතුව** | 101.17 | 45.59 | 146.76 |

**(4.2)** <u>වාණිජමය කාර්යයන් තුලින් 2013 වර්ෂයේ ඉපැයීම්</u>

| | | (රු. මි) |
|---|---|---|
| කජු මද අලෙවිය | - | 79.43 |
| කජු මව් බීජ හා පැළ අලෙවිය | - | 64.71 |
| පොල් අලෙවිය | - | 0.45 |
| **එකතුව** | - | 144.59 |

**(05).** <u>පරිපාලන කටයුතු</u>

**(5.1)** කුඩා කජු ඉඩම් හිමියන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සෙවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කලමනාකරණ භාවිතයන් සිදුකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සෙවාවන් සපයන අතර, ලාභ ඉපැයීමද අරමුණුකර ඇති බැවින් සංස්ථාවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහාය මේ සඳහා ලබාගත හැකිවිය.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, කළමනාකරුවන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහායද නොමඳව ලැබුණි.

රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහාද, මේ අනුව කටයුතු කලහැකි විය.

සංස්ථාවේ නව සංවිධාන ව්‍යුහය, බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටීන් ප්‍රතිසංවිධානය කිරීමට අදාල යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබුණි.

**(5.2)** 2013-12-31 දිනට **කාර්යය මණ්ඩලයේ තත්ත්වය**

| අනුමත කාර්ය මණ්ඩලය | 2013-12-31 දිනට |
|---|---|
| ඉහළ කළමනාකරණ ශ්‍රේණිය | 01 |
| කළමනාකරණ ශ්‍රේණිය | 07 |
| විධායක ශ්‍රේණිය | 05 |
| කළමනාකරණ සහකාර ශ්‍රේණිය | 124 |
| සුළු ශ්‍රේණිය | 55 |
| **මුළු ගණන** | 189 |

මෙයට අමතරව සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා මධ්‍යම පැළ තවාන් වල මාසික අවශ්‍යතා මත චෙක් රෝල් කම්කරුවන් 350 ක් පමණ සෙවයේ යොදවා ඇත.

**(06)**. **ජයග්‍රහණ**

වර්ෂ 2011 දී හා 2012 දී වාර්තාගත වූ ලාභ ලබන තත්ත්වය වර්ෂ 2013 දී අඛණ්ඩව පවත්වාගැනීමට සමත්විය. මේ සඳහා සංස්ථාවේ වාණිජමය හා පැළ නිෂ්පාදන ක්‍රියාකාරකම් උපයෝගි කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මඟ පෙන්වීම හා කාර්යය මණ්ඩලයේ කැපවීම මේ සඳහා හේතු

සාධක විය. වාණිජමය ක්‍රියාකාරකම් මගින් 2013 වර්ෂය තුලදී සංස්ථාව උපයනු ලැබූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 38.30 කි.

පහත සඳහන් බාධක නිසා අත්පත් කරගත් ලාභය මීට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

- අයහපත් කාලගුණ තත්ත්වයන් මත වතුයායන් වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.

- දේශීය ලෙලිකජු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම නිසා කජු නිෂ්පාදනවලට ඉහළ මිලගණන් නියම වීම.

- කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.

- පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සෙවාවන් ඉටුකර ගැනීමේදී බාධා පැමිණුනි. මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.

**(07).** <u>ස්තුතිය</u>

වසර 3½ ක් වැනි කෙටිකාලයක් තුල ශ්‍රී ලංකා කජු සංස්ථාව සාධනීය තත්ත්වයකට පරිවර්තනය කිරීමට මා හට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන්වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරීවරයා, කළමනාකරුවන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතුකල අතර, ඔවුන්ගේ සේවය ඉතා අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ලඟාකර ගැනීමට හැකිවූ අතර, එයද අගය කරමි.

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අපවෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන්ද ස්තුතිවන්ත වෙමි.

**සනත් වීරකෝන්**

**සභාපති**

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

<u>අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව</u>

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය පකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමග ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජූනි මස 2 වනදා නිකුත් කල චකලේඛ අංක පීඊඩී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය පකාශන 2014 පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**ආරම්භය**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතතුමාගේ නියෝගය මත රුපියල් මිලියන 40 ක මූලික පග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

**පතිඵල**

පවර්ථන වසරෙහි මූල්‍ය පතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිලිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ පකාශනය හා මූල්‍ය පකාශන මගින් අනාවරණය කර ඇත.

**ව්‍යාපාර සමාලෝචනය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව පකාශනයෙහි දක්වා ඇති අතර ඒ පිලිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවෙහි ඇතුලත් කර ඇත.

**දේපල පිරියත හා උපකරණ**

මූල්‍ය පකාශනයෙහි පවර්ථන වසරට අදාලව දේපල පිරියත හා උපකරණ වල සිදු වූ වෙනස්කම් සටහන් අංක 1 මගින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා පමාණාත්මක වෙනස්කම් නොපවතී.

**පධාන කියාකාරකම්**

ශී ලංකා කජු සංස්ථාවේ පධාන කියාකාරකම් පහත පරිදි වේ.

- කජු වගා කිරීම. පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට උපදෙස් දීම.

- කජු වගා කිරීම. පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු කිරීම.

- කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

- කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම පිළියෙල කිරීම පසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව කියා කිරීම.

- කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන ඒවායේ පමාණය හා තාක්ෂණික පමිති නිෂ්චය කිරීම සහ අලුත්

කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථා වලදී එවකට පවතින කර්මාන්තශාලා කියා කරවීම.

- කපු සහ කපු නිෂ්පාදන මිලට ගැනීම බෙදා හැරීම විකිණීම සහ අපනයනය කිරීම.

- කපු වගා කිරීම. පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිනිස පහසුකම් සැපයීම.

- කපු වගාවන් පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාර දීම.

- කපු නිෂ්පාදන පචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා පචාරක කටයුතුවලට මුදල් යෙදවීම. ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට අධාරදීම ආරම්භ කොට ඊට අනුගහ දැක්වීම.

**සංචිත**

ස්කන්ධය වෙනස් වීමේ පකාශනය තුල සංස්ථාවේ මුලු සංචිත වල සංයුතිය සඳහන්ව ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

2013 දෙසැම්බර් 31 දින වන විට තේරී පත් වී සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

(1). 2013.01.01 දින සිට 2013.09.20 දින දක්වා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

| <u>සාමාජිකයාගේ නම</u> | | <u>තනතුර</u> |
|---|---|---|
| 1. | එස් වීරකෝන් මහතා | සභාපති |
| 2. | එස්.කේ.ගුණපාල මහතා | නියෝජ්‍ය සභාපති |
| 3. | එම්.ඩී.අබේගුණවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත |
| 4. | ඩබ්.වී.පනාන්දු මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | ඩබ්.පී.ඥාණසිරි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | එච්.ගුණවර්ධන මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | සී.ජේ.අන්ද්‍රාදි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

(2). 2013.09.21 දින සිට පත්වූ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්

| <u>සාමාජිකයාගේ නම</u> | | <u>තනතුර</u> |
|---|---|---|
| 1. | එස්.වීරකෝන් මහතා | සභාපති |
| 2. | එච්.ගුණවර්ධන මහතා | නියෝජ්‍ය සභාපති |
| 3. | එම්.ඩී.අබේගුණවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත |
| 4. | යූ.සිල්වා මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | එල්.කුරේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | ඒ.එම්.අම්බාස් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | කේ.විදානපතිරණ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

2013 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් : වී.යූ.ලියනගේ මහතා

**විගණන කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සෙවකටන්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව ගෙවා ඇත.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

**මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මගින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

**විගණකවරු**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත.



**වී.යූ. ලියනගේ**

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

## ශ්‍රී ලංකා කපු සංස්ථාව

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2005.07.01. දිනැති අංක 31 දරණ (PED 31) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චකලේඛයේ උපදෙස් පකාරව හා එම චකලේඛයට අදාලව වරින්වර සිදුකරන ලද සංශෝධනයන් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අංක 51,53 හා 55 යන චකලේඛයන් (PED 51, PED 53 හා PED 55) මඟින් ලබා දී ඇති උපදෙස් පකාරව ශ්‍රී ලංකා කපු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් හා එක් නිරීක්ෂකයෙකුගෙන් යුක්ත සමස්තය 08 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විය.

අදාල කමිටුවේ සභාපතිවරයා ලෙස මූල්‍ය කටයුතු පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ද කමිටුවේ ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/අභ්‍යන්තර විගණක ද කටයුතු කරන ලදී.

2013 වර්ෂය හා අදාලව පවත්වන ලද සමස්ත විගණන හා කළමනාකරණ කමිටු ගණන 03 ක් වූ අතර, එම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ හා නිරීක්ෂකයන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

01. ඩබ්.වී.පනාන්දු මහතා : කමිටු සභාපති 3/3
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2013.01.16. දින සිට 2013.09.20.දක්වා

02. එම්.ඩී.අබේගුණවර්ධන මිය : කමිටු සාමාජික 2/3
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2013.01.16.දින සිට
(මහා භාණ්ඩාගාර නියෝජිත)

03. හසිත ගුණවර්ධන මහතා : කමිටු සාමාජික 3/3
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2013.01.16 දින සිට 2013.09.20.දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 04. | සී.ජේ.අන්ද්‍රාදි මහතා | : | කමිටු සාමාජික | 2/3 |
| | විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2013.01.16. දින සිට 2013.04.30.දින දක්වා | | | |
| 05. | ඩී.කේ.ජයකොඩිආරච්චි මහතා | : | කමිටු සාමාජික | 2/3 |
| | සාමාන්‍යාධිකාරි | | | |
| 06. | එම්.ටී.එස්.කේ.පීරිස් මහතා | : | කමිටු සාමාජික | 2/3 |
| | කළමනාකාර - මුදල් | | | |
| 07. | වී.යූ.ලියනගේ මහතා | : | කමිටු ලේකම් | 3/3 |
| | අභ්‍යන්තර විගණක හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | | | |
| 08. | එස්.ආර්.පනාන්දු මිය | : | කමිටු සාමාජික | 1/3 |
| | වැඩ බලන කළමනාකාර - පාලන - 2013.06.04. දින සිට | | | |
| 09. | ඒ.පී.ජී.අතුකෝරාළ මහත්මිය | : | කමිටු නිරීක්ෂක | 3/3 |
| | විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත | | | |

2013 වර්ෂය තුළදී පවත්වන ලද පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ඒ සඳහා පත්වූ සියලු විධායක නොවන අධ්‍යක්ෂවරුන් නව කමිටු සාමාජිකයන් වූ බැවින් රාජ්‍ය ව්‍යාපාරයක විගණන හා කළමනාකරණ කමිටුව මඟින් සිදුවිය යුතු කාර්යභාරය සම්බන්ධයෙන් අදාල චකලේඛ හා මාර්ගෝපදේශ ඇසුරින් දීර්ඝ වශයෙන් සාකච්ඡාකරන ලදී. එහිදී සංස්ථාවේ එදිනෙදා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද නව කමිටු සාමාජිකයන්ට දීර්ඝ වශයෙන් පැහැදිලි කර දෙන ලදී.

මෙම වර්ෂය හා අදාලව පවත්වන ලද දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව සඳහා පිළියෙල කරන ලදුව කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ සංස්ථාවේ සමස්ත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාල මූල්‍ය

පගතිය හා භෞතික පගතිය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් දීර්ඝ සමාලෝචනයක් සිදු කරන ලදී. මේ අනුව අදාල නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.

එසෙම අදාල කමිටු රැස්වීම පවත්වන ලද දිනය වනවිට සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් නිකුත් කර තිබූ සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගත නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණ සම්බන්ධයෙන් පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ද කමිටුව මඟින් සමාලෝචනයක් සිදුකරන ලදී.

සමාලෝචිත වර්ෂය හා අදාලව පැවැත්වූ තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද අදාල වර්ෂයේ දෙවන කාර්තුව සඳහා පිළියෙල කර තිබූ සංස්ථාවේ සමස්ත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මූල්‍ය පගතිය හා භෞතික පගතිය පිළිබඳ වාර්තාවේ හා එදිනට නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන වාර්තාවන් සම්බන්ධ සාරාංශගත වාර්තාවේ ඇතුලත් කරුණු සම්බන්ධයෙන් සමාලෝචනයන් සිදුකර අදාල නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පරිශීලනය පිණිස ඉදිරිපත් කරන ලදී.



**ඩබ්.වී.පනාන්දු**

**සභාපති**

**විගණන හා කළමනාකරණ කමිටුව**

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2013 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

## 01. කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

### 1.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 2500 ක් හා බීජ කජු අක්කර 1850 ක් වශයෙන් මුළු අක්කර 4350 ක් දිස්ත්‍රිකක් 18 ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 4008 ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. මේ සඳහා වැයවුණු මුළු වියදම රු.මිලියන 13.48 කි.

### 1.2 ව්‍යාප්ති සෙවා ජාලය පුළුල් කිරීම

ප්‍රථම වරට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ආවරණය කිරීම සඳහා ත්‍රිකුණාමල ප්‍රාදේශිය කාර්යාලය සහ උතුරු පලාතේ කිලිනොච්චි, මුලතිවු, යාපනය දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවීමට කටයුතු කරන ලදී.

### 1.3 'දිවි නැගුම' ජාතික සංවර්ධන වැඩසටහන

ගෙවතු වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 12 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 85 ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් වෙත ලබාදීම සඳහා බද්ධ පැළ 294000 ක් නිෂ්පාදනය කරන ලද අතර, වසර අවසානය වනවිට බද්ධ පැළ 198494 ක් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත ලබාදී ගොවි ඉඩම්වල රෝපණය කර ඇත. මෙමගින් සංස්ථාව වෙත ලැබුණු ආදායම රු.මිලියන 40.0 කි. පැවති අයහපත්

කාලගුණය නිසා ගොවීන්වෙත පැළ නිකුත් කිරීම සීමා වූ අතර, ඉතිරි පැළ ප්‍රමාණය 2014 යල කන්නය ආරම්භය සමඟින් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

### 1.4 'දැයට කිරුළ' ජාතික සංවර්ධන වැඩසටහන

2013 වර්ෂයේදි කුලියාපිටියේදි පැවැත්වූ 'දැයට කිරුළ' ජාතික ප්‍රදර්ශනයේදී සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටියතුල සංස්ථාව විසින් සපයනු ලබන සෙවාවන් සහ අලෙවි කුටියක් ඇතුලත් ප්‍රදර්ශන කුටියක් මගින් කජු වගාව සඳහා උනන්දුවන්නන් හට අවශ්‍ය සියළු උපදේශාත්මක සෙවා මුද්‍රිත මාධ්‍යයෙන් හා පර්යේෂණ නිලධාරීන් මගින් ලබාදිමට හැකිවිය. මේ සඳහා වැයවූ මුදල රු. මිලියන 1.2 කි.

### 1.5. 'දැයට කිරුළ' ජංගම සෙවය

'දැයට කිරුළ' වැඩසටහන යටතේ කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ජංගම සෙවා වැඩසටහන් 935 ක් සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නිලධාරීන් සහභාගී වූ අතර, මෙහිදී ගැටළු 816 ක් සඳහා ගොවීන්හට විසඳුම් ලබාදෙන ලදී. මෙම ගැටළු අතර, කජු වගාව ආශ්‍රිත ගැටළු, සහනාධාර සෙවා ලබාදීම්, පළිබෝධ මර්ධනය, කජු පිරිසැකසුම්කරණය, තත්ත්ව පාලනය, අගය එකතු කිරීම, අලෙවිකරණය ආදි ගැටළු  සඳහා විසඳුම් ලබාදෙන ලදි.

## 02. වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

### 2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර කුඩා කජු ඉඩම්හිමියන්වෙත ලබාදිම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද,

අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුරආර යන ශාක අභිජනන මධ්‍යස්ථාන නඩත්තුකරන ලදී. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත මවුබීජ මිලියන 1.1 ක් හා අංකුර 300000 ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 6.5 කි.

## 2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

කජු වගාවේ පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවිම සඳහා වැඩමුළු 08 ක් අනුරාධපුරය, මුලතිවු, පුත්තලම, කුරුණෑගල, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ මුල්‍යාධාර මත පවත්වන ලද මෙම වැඩමුළු සඳහා කුඩා ඉඩම්හිමියන් 360 ක් සහභාගී විය. මේ සඳහා වැයවූ මුළු වියදම රු. මිලියන 0.21 කි.

## 2.3 පැළ තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 07ක් කමන්දළුව වතුයායේ හා අළුත්තරම, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල හා කුඹුක්කන පිහිටා ඇත. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන බද්ධ පැළ නිපදවීම සඳහා පොලිදැල් ගෘහ 06 ක් කමන්දළුව, මිහින්තලේ, මඩකලපුව, අළුත්තරම පැළ තවාන්වල ඉදිකර ඇත. මෙම තවාන්වල 2013 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 468714 ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී.

# 03. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ සනත්වය, කජු වගාවේ පළිබෝධ මර්ධනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්,

අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සෙවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. මේ සඳහා වැයවූ මුදල රු .මිලියන 3.0 කි.

## 04. සංස්ථා වතුයායන් නඩත්තු කිරීම හා වගා පුනරුත්ථාපනය

කමන්දළුව, පුත්තලම ආච්චිගෙවත්ත, හාඩි, ඔයාමඩුව, කොණ්ඩච්චි හා මාන්කර්ණි වතුයායන් සහ මුළු අක්කර 630 ක් පමණ වගා පුනරුත්ථාපන කටයුතු සිදුකරන ලදී. කොණ්ඩච්චි සහ මාණ්කර්ණි වතුයායන්වල වගා කටයුතු සිදුකිරිම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදුකරන ලදි. වතුයායන්වලින් මෙට්‍රික් ටොන් 72.0 ක ලෙලිකපු අස්වැන්නක් ලැබුණි. මීට අමතරව ඵලදායිතාවය ඉහළ නැංවිම පිණිස රසායනික පොහොර යෙදිම සහ වල් මර්ධන කටයුතු සිදුකරන ලදී.  වතුයායන්හි කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා ට්‍රැක්ටර් 02 ක් හා කෘෂි උපකරණ මිලදීගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 13.9 කි.

## 05. පසු අස්වනු තාක්ෂණය

### 5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

වෙළඳපොල තරඟකාරී තත්ත්වයන් යටතේ ලෙලිකපු කිලෝග්‍රෑමයකට රු 200/- ත් 250/- ත් අතර මුදලක් ලැබෙන පරදි ලෙලිකපු කිලෝ 27000 ක් සංස්ථාව විසින් මිලට ගන්නා ලදි. සංස්ථා වතුයායන්ගෙන් ලද අස්වැන්න සහ ගොවීන්ගෙන් මිලදිගත් ලෙලිකපු පුත්තලම සහ නැඳගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. එවා අගය එකතුකල නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවිසැල් 11 කින් සමන්විත සංස්ථා අලෙවිසැල් ජාලයක් උපයෝගි කරගන්නා ලදි. අගය එකතුකල නව නිෂ්පාදන 06 ක් පාරිභෝගිකයන් වෙත ඉදිරිපත්කල හැකිවූ අතර, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රම භාවිතය (GMP) පිළිබඳව කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන් සහ අපනයනකරුවන් දැනුවත්කිරීම සහ පුහුණු සිදුකරන ලදී.

අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු. මිලියන 79. 43 කි.

## 06. කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

### 6.1 වයින් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම

සෑම කජු වාරයකදීම කජු පුහුලන් කිසිඳු ප්‍රයෝජනයකට අපතේ යයි. සංස්ථාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ වයින් නිෂ්පාදනාගාරයක් ආරම්භ කරන ලදි. 2013 වර්ෂය අවසානයේදී මෙමගින් වයින් බෝතල් 4500 ක් නිෂ්පාදනය කල අතර, ඉදිරි වර්ෂයේදි මෙම නිෂ්පාදන ධාරිතාවය වැඩිදියුණු කිරීම තුලින් අපතේ යන කජු පුහුලන් සඳහා වැඩි වටිනාකමක් ලබාදීමට කටයුතු කරනු ඇත. මෙම වයින් ඉහළ ප්‍රමිතියකින් යුක්ත වන අතර, ආනයනික වයින් සමඟ තරඟකල හැකි මට්ටමින් නිෂ්පාදනය කල හැකිය.

### 6.2 කජු පුහුලන් ආශ්‍රිත පලතුරුබීම නිෂ්පාදනය

මේ යටතේ අපතේයන කජු පුහුලන් භාවිතාකර, පලතුරු බීම (Beverage) නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණය සහ පුහුණුව බ්‍රසීල රජයේ අනුග්‍රහයෙන් ලබාගැනීමට කටයුතු කර ඇත. මෙම පුහුණුව සඳහා සංස්ථාවේ පර්යේෂණ නිලධාරීවරයකු හා පෞද්ගලික අංශයේ පලතුරු බීම නිෂ්පාදකයකු සහභාගී වූ අතර, 2014 වර්ෂයේ කජු අස්වැන්න ලැබීමත් සමඟින් මෙම බීම පර්යේෂණ මට්ටමින් වෙළඳපොලට නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

## 07. මානව සම්පත් සංවර්ධනය

කම්කරු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් සංස්ථා කාර්ය මණ්ඩලයේ 60 දෙනෙකු සඳහා සෙවාස්ථ පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. මීට අමතරව සුළු අපනයන භෝග ප්‍රවර්ධනන අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. මේ සඳහා මධ්‍යම මට්ටමේ නිලධාරීන් 08 දෙනෙකු හා කළමනාකරණ සහකාරවරුන් 28 දෙනෙකු සහභාගී විය. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 0.57 කි.

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලින ක්‍රියාමාර්ග කිහිපයකි.

01. **ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**

02. **කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම**

03. **කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය**

04. **මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.**

### 01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

#### 1.1 ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි දේශගුණික කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03 ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000 ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 10000 කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 4500 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කරනු ඇත.

'දිවි නැගුම' ජාතික වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 12 ක ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, වාර්ෂිකව බද්ධ පැළ 300000 ක් හා බීජ පැළ 500000 ක් වශයෙන් මුළු පැළ 800000 ක් පමණ නිෂ්පාදනය කර

රෝපණය කිරීමට කටයුතු කරනු ඇත. මෙය ඉදිරි වසර තුන තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ. මේ අනුව ආසන්න වශයෙන් වසරකට අමතර අක්කර 8000 ක ප්‍රමාණයක කප්පු වගාකෙරේ.

'දිවි නැගුම' වාණිජ වගා ඒකක සංවර්ධන වැඩසටහන යටතේ අක්කර 02 බැගින් වූ කුඩා ඉඩම් ඒකක කප්පු වගාව මගින් සංවර්ධනය කරනු ලැබේ. වසරකට අක්කර 2000 බැගින් ඉදිරි වසර තුන තුලදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

## 1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන් වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. මේ යටතේ උතුරු පළාතේ කොන්ඩච්චි වතුයාය, නැගෙනහිර පළාතේ මාණ්කර්නි වතුයාය සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ආරම්භ කරන ලදී. පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම හා හාඩි වතුයායන්වල වාර්ෂිකව අක්කර 300 බැගින් නව වගාව/ වගා පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ කොන්ඩච්චි හා මාන්කර්ණි වතුයායන්වල ඉදිරි වසර 3 තුලදී අක්කර 2000 ක් පමණ අළුතින් වගාකිරීමට සැළසුම් කර ඇත.

## 1.3 නව වගාව

කුඩා ඉඩම් හිමියන් සතු කප්පු වගාවන් වල නව වගාවද වාර්ෂිකව අක්කර 500 බැගින් සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. **ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 15000 බැගින් කප්පු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.** මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 10 කින් සමන්විත ව්‍යාප්ති සෙවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 18 ක කප්පු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

## 02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 111,000 ක් පමණ වන අතර, මින් 88% ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන්වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස් වල වයස අවුරුදු 20-35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කිලෝ ග්‍රෑම් 3-5 ක් අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරනලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි රටවල ගසකින් කිලෝ ග්‍රෑම් 10-15 ත් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

### 2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කල නව ප්‍රභේද 08 ක් සංස්ථාව විසින් ගොවීන්වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 1 WUCC 5, WUCC 8, WUCC 9, WUCC 13, WUCC 19, WUCC 21, WUCC23 යන ප්‍රභේද 08 එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය, සුදුවතුර ආර හා ඔයාමඩුව යන වතුයායන් හා ශාක අභිජනන මධ්‍යස්ථානවල වගා කර ඇත.මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කිලෝග්‍රෑම් 1000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

### 2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (Good Agricultural Practices) කජු වගාවේ අස්වනු

ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැව්ළි කලමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදීද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත වේ.

මේ නිසා කජු අස්වැන්න 30%-40% ත් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 2.3 <u>මධ්‍යම පැළ තවාන්</u>

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, අළුත්තරම, කුඹුක්කන, හාඩි වතුයාය හා චන්ද්‍රිකාවැව යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ. වාර්ෂිකව බද්ධ පැළ 520,000 ක් නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුලදීද වසරකට පැළ 500,000 ක් බැගින් නිපදවීම අරමුණු කර ඇත. ' දිවි නැගුම' ජාතික වැඩසටහන යටතේ පොලි දැල් ගෘහ 06 ක් මෙම තවන් තුල ස්ථාපනය කර ඇති අතර, ඒ අනුව පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

## 03. <u>කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය</u>

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලිකජු මෙට්‍රික් ටොන් 10000- 12000 ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය මද පරිභෝජනයද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 1800/- ත් රු. 2400/- ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

## 3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලීකරණ යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

## 3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව

පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 150 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling machine) හා විජලීකරණ යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුමිලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාක්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## 3.3 ගොවීන්ගෙන් ලෙලිකජු මිලට ගැනීම

සංස්ථා වතුයායන් වලින් ලැබෙන අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදූකිරීම සඳහා අවශ්‍ය ලෙලි කජු ගොවීන්ගෙන් මිලට ගැනීම පසුගිය වසර තුලදී සිදූකරන ලදී. සංස්ථාවේ ප්‍රාදේශීය කලමනාකරුවන් හා ව්‍යාප්ති නිලධාරීන් විසින් මෙම කාර්යය සිදූකරනු ලැබේ. මෙමගින් ගොවි නිෂ්පාදන වලට ඉහළ මිලක් ලැබුණු අතර, අතරමැදියන් විසින් ගොවීන්ගෙන් අඩුමිලට ලෙලිකජු මිලදී ගැනීම වැළැක්වුණු බැවින් ස්ථාවර මිලක් ගොවීන්ට ලබාගැනීමට හැකියාව ලැබුණි. ඉදිරි වර්ෂ 3 තුලදීද ලෙලිකජු ගොවීන්ගෙන් මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ගොවීන්ගෙන් කජු මද මිලදීගැනීමද සිදූකරන ලදී.

## 3.4 කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන්කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් ටොන් 10,000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. සංස්ථාව විසින් කජු පුහුලන් භාවිතයෙන් වයින් නිපදවීම ආරම්භ කර ඇති අතර, ඒ සඳහා වයින් නිෂ්පාදනාගාරයක්

(Winery) පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත. මෙමගින් වාර්ෂිකව උසස් තත්ත්වයේ වයින් වාර්ෂිකව බෝතල් 4500 ක් නිෂ්පාදනය කිරීමටත්, එහි ප්‍රගතිය මත ඉදිරි වසර 3 තුල අඛණ්ඩව කජු පුහුලන් භාවිතයෙන් වයින් නිෂ්පාදනය කර වෙළඳපොලට නිකුත් කිරීමටත් බලාපොරොත්තු වේ .

මීට අමතරව කජු පුහුලන් භාවිතකර Non Alcoholic Beverages ජෑම්, කෝඩියල් වැනි අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. මේ පිළිබඳව

විශෙෂ පුහුණු වැඩසටහනක් බ්‍රසීලයේදී පැවැත්වූ අතර, පර්යේෂණ මට්ටමින් බීම නිෂ්පාදනය කිරීම 2014 කප්පු අස්වනු වාරයේදී ආරම්භ කරනු ඇත.

# 4.0 මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම

## 4.1 මානව සම්පත පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සෙවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් කාර්ය මණ්ඩලයේ 60 දෙනෙකු සඳහා සෙවාස්ථ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් පවත්වන ලදී. මේ සඳහා කනිෂ්ඨ විධායක නිලධාරීන් 08 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරුන් 50 දෙනෙකු සහභාගී විය. මෙමගින්කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩප්‍රස්ථා සැලසෙ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන් සංවිධානය කිරීමේදි සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා ජාතික වැවිලි කලමනාකරණ ආයතනයේද සහාය ලබාගැනේ.

## 4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්ය සාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවළියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමටත්, ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත. මෙමගින් කාර්ය මණ්ඩල ව්‍යුහය තුල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලිකාංග

සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තරාතිරම්වල කාර්ය සාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

## ශ්‍රී ලංකා කපු සංස්ථාව
## 2013.12.31 දිනට ඒකාබද්ධ ශෙෂ පත්‍රය

| 2012.12.31 රු. | | සටහන | රු. | රු. |
|---|---|---|---|---|
| | වත්කම් | | | |
| | ජංගම නොවන වත්කම් | | | |
| 64,986,141.84 | දේපළ පිරියත හා උපකරණ | 01 | 63,915,955.56 | |
| 31,619,684.51 | මේරූ පදේශ නඩත්තුව | 02 | 30,465,749.11 | |
| 19,981,804.19 | නොමේරූ පදේශ නඩත්තුව | 03 | 29,288,491.33 | |
| - | කෙරිගෙන යන වැඩ - පාග්ධන | | 215,375.77 | |
| 707,535.39 | අනෙකුත් කුඩා ව්‍යාපෘති | 04 | 618,787.46 | |
| 117,295,165.93 | මුළු ජංගම නොවන වත්කම් | | | 124,504,359.23 |
| | ජංගම වත්කම් | | | |
| 46,135,309.65 | තොග | 05 | 29,460,013.42 | |
| 70,822,069.30 | වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 06 | 60,042,256.09 | |
| 3,373,592.53 | තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 07 | 5,460,727.53 | |
| 28,675,795.93 | මුදල් සහ මුදල් සමාන දෑ | 08 | 66,529,295.29 | |
| 149,006,767.41 | මුළු ජංගම වත්කම් | | | 161,492,292.33 |
| **266,301,933.34** | මුළු වත්කම් | | | **285,996,651.56** |
| | ස්කන්ධ සහ වගකීම් | | | |
| | ස්කන්ධ | | | |
| 40,000,000.00 | මූලික පාග්ධනය | | 40,000,000.00 | |
| 34,959,185.36 | රාජ්‍ය පදාන | | 58,744,656.00 | - |
| 17,910,572.05 | අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු පදාන | 09 | 19,691,009.66 | |
| 23,676,376.25 | පාග්ධන සංචිත | 10 | 22,241,383.25 | |
| 77,787,906.97 | ලාභ අලාභ ගිණුම | | 81,339,297.02 | |
| 194,334,040.63 | මුළු ස්කන්ධ | | | 222,016,345.93 |
| | ජංගම නොවන වගකීම් | | | |
| 31,271,754.62 | පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | | 33,874,951.54 | |
| 6,513,024.00 | වාහන කල් බදු | | 3,256,512.00 | |
| 37,784,778.62 | මුළු ජංගම නොවන වගකීම් | | 37,131,463.54 | |
| | මුළු ජංගම වගකීම් | | | |
| 34,183,114.09 | වෙළෙඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ | 11 | 26,848,842.09 | |
| 34,183,114.09 | ජංගම වගකීම් | | | 63,980,305.63 |
| **266,301,933.34** | මුළු ස්කන්ධ සහ වගකීම් | | | **285,996,651.56** |

එම්.ටී.එස්.කේ.පීරිස්
කළමණාකාර මුදල්

සනත් වීරකෝන්
සභාපති

## ශ්‍රී ලංකා කපු සංස්ථාව

**පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති** - 2013

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදි. වර්ෂය තුල මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදි. වර්ෂය තුල නිම කරන ලද ගොඩනැගිළි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදි.

03. ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍ර සූත්‍ර | 10% |
| මෙවලම් සහ උපකරණ | 10% |
| කාර්යාලීය උපකරණ | 10% |
| නළ ළිං / වගා ළිං | 10% |
| ලී බඩු උපකරණ සහ සවිකිරීම් | 06% |
| ස්ථිර ගොඩනැගිලි | 03% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 33% |

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදි.

| | |
|---|---|
| කපු මද | : ශුද්ධ විකුණුම් මිලෙන් |
| කපු ඇට | : සහතික කළ වෙනස් වන මිල / වෙළෙඳ පොළ මිල |
| ගව සහ බැටළු | : ඒ ඒ පලාත්වල වෙළෙඳ මිල / ජීව බර අනුව |
| පොල් | : ශුද්ධ විකුණුම් මිල |
| අනෙකුත් සියළුම තොග | : පිරිවැයට, ගණනය කරන ලදි. |

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් මේරූ, නොමේරූ ප්‍රදේශ පැලතවාන් සහ සත්වපාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. මේරූ ප්‍රදේශ වල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදි.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස, වර්ෂය තුල බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදි.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂිත දීමනා පනතේ සඳහන් පරිදි සෙවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනට අනුව ගණනය කරන ලදි. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සෙවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ වූ අයගේ සෙවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. මෙම සංස්ථාව වෙත රජය මගින් වෙන් කරන ලද ප්‍රාග්ධන පදාන මුදලින් උපලබ්ධි වූ පසු ශ්‍රී ලංකා ගිණුම්කරණ පමිතවලට අනුව දිගුකල් වත්කම් ලෙස හඳුනාගත හැකි ප්‍රාග්ධන වත්කම් හා සංවර්ධන කාර්යයන් අනුසාරයෙන් ඒවා ගිණුම් පොත්වල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රාග්ධන වත්කම් හි ක්ෂයවීම් හා කමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුලත් කර ඇති සත්‍ය වටිනාකම් අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන පදානවලින් ඉවත් කර ගිණුම්පොත්වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පතයට අදාල සටහන්

සටහන් 01

**දේපල පිරියත සහ උපකරණ :**

| විස්තරය | පිරිවැය/පත්‍යාගණන අගය 2013.12.31 (රු.) | අදාල වසරේ වත්කම් එකතුවීම් / පත්‍යාගණන (රු.) | අදාල වසරේ වත්කම් ඉවත්කිරීම් / විකුණුම් (රු.) | වත්කමේ වර්තමාන පිරිවැය/පත්‍යාගණන වටිනාකම (රු.) | 2013.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.) | ලියා හරින ලද අගය 2013.12.31 (රු.) |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,516,899.57 | - | - | 9,516,899.57 | - | 9,516,899.57 |
| ගොඩනැගිලි | 38,295,231.84 | 1,437,411.54 | - | 39,732,643.38 | 13,523,254.98 | 26,209,388.40 |
| වාහන | 46,831,692.84 | 4,695,025.00 | 1,460,000.00 | 50,066,717.84 | 35,201,040.70 | 14,865,677.14 |
| යන්ත්‍ර සූත්‍ර | 10,968,023.45 | 3,082,514.00 | 11,217.00 | 14,039,320.45 | 8,495,727.42 | 5,543,593.03 |
| මෙවලම් හා උපකරණ | 8,122,348.92 | 375,966.01 | 8,867.50 | 8,489,447.43 | 7,397,519.75 | 1,091,927.68 |
| කාර්යාලීය උපකරණ | 9,340,078.49 | 428,849.00 | 925.00 | 9,768,002.49 | 7,128,006.07 | 2,639,996.42 |
| ලී බඩු හා සවිකිරීම් | 5,393,592.46 | 736,312.00 | 42,017.64 | 6,087,886.82 | 3,527,220.04 | 2,560,666.78 |
| නළ ළිං | 420,785.00 | 405,897.00 | - | 826,682.00 | 378,245.85 | 448,436.15 |
| වගා ළිං | 428,699.00 | 70,800.00 | - | 499,499.00 | 68,953.23 | 430,545.77 |
| වැව් | 608,824.62 | - | - | 608,824.62 | - | 608,824.62 |
| | **129,926,176.19** | **11,232,774.55** | **1,523,027.14** | **139,635,923.60** | **75,719,968.04** | **63,915,955.56** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පතයට අදාල සටහන්

<u>සටහන් 02</u>

| | | | |
|---|---|---|---|
| මේරූ පදේශ | - කජු | (සටහන් 2 අ) | 27,818,035.17 |
| | - පොල් | (සටහන් 2 ආ) | 2,647,713.94 |
| | | | **30,465,749.11** |

<u>සටහන් 02 (අ)</u>

<u>මේරූ පුදේශ - කජු</u>

| වතුයාය | පිරිවැය 2013.01.01 (රු.) | 2013.12.31දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2013.12.31 (රු.) |
|---|---|---|---|
| හාඩි වතුයාය | 2,736,310.00 | 1,524,172.57 | 1,212,137.43 |
| කමන්දළුව වතුයාය | 14,089,138.40 | 9,189,675.47 | 4,899,462.93 |
| පුත්තලම වතුයාය | 27,311,754.96 | 15,323,207.67 | 11,988,547.29 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 13,933,185.28 | 7,478,919.30 | 6,454,265.98 |
| විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | 655,569.86 | 64,848.82 | 590,721.04 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 3,054,708.90 | 381,808.40 | 2,672,900.50 |
| | **61,780,667.40** | **33,962,632.23** | **27,818,035.17** |

<u>සටහන් 02 (ආ)</u>

මේරූ පදේශ :(පොල්)

| වතුයාය | පිරිවැය 2013.01.01 (රු.) | 2013.12.31 දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2013.12.31 (රු.) |
|---|---|---|---|
| හාඩි වතුයාය | 1,369,822.51 | 342,455.65 | 1,027,366.86 |
| කමන්දළුව වතුයාය | 2,437,602.22 | 957,663.21 | 1,479,939.01 |
| පුත්තලම වතුයාය | 431,998.76 | 291,600.69 | 140,398.07 |
| | **4,239,423.49** | **1,591,719.55** | **2,647,703.94** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පතයට අදාල සටහන්

<u>සටහන් 03</u>

| | | |
|---|---|---|
| නොමේරූ පදේශ - කජු | (සටහන 3 අ) | 25,434,116.93 |
| - පොල් | (සටහන 3 ආ) | 3,854,374.40 |
| | | 29,288,491.33 |

<u>(සටහන 3 අ)</u>

<u>නොමේරූ පදේශ - (කජු)</u>

| වතුයාය | 2013.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 892,934.72 |
| කමන්දළුව වතුයාය | 3,675,273.61 |
| පුත්තලම වතුයාය | 5,299,596.79 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 404,789.11 |
| මාන්ක(ර්)නි වතුයාය | 987,343.50 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 2,714,062.67 |
| මහඔය බීජ උද්‍යානය | 1,456,281.30 |
| මොණරාගල බීජ උද්‍යානය | 1,936,618.75 |
| පර්යේෂණ හා සංවර්ධන | 1,344,902.55 |
| නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | 135,360.40 |
| ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 6,586,953.53 |
| | **25,434,116.93** |

<u>සටහන් 03 (ආ)</u>

<u>නොමේරූ පදේශ : (පොල්)</u>

| වතුයාය | 2013.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 1,647,938.19 |
| කමන්දළුව වතුයාය | 729,130.33 |
| පුත්තලම වතුයාය | 630,182.49 |
| ඔයාමඩු ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 847,123.39 |
| | **3,854,374.40** |

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පතයට අදාල සටහන්

සටහන් 04

අනෙකුත් කුඩා ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | 2013.12.31. දිනට පිරිවැය |
|---|---|
| තේක්ක පැල ව්‍යාපෘතිය | 297,838.41 |
| පැපොල් ව්‍යාපෘතිය | 320,949.05 |
| | **618,787.46** |

සටහන් 05

ජංගම වත්කම්

**තොග**

| | |
|---|---|
| විවිධ | 3,934,664.41 |
| වයින් | 927,530.00 |
| සත්ව පාලනය | 3,150,025.00 |
| කජු මද | 14,952,262.50 |
| කජු ඇට | 1,777,327.86 |
| පැල | 3,932,735.44 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 770,216.21 |
| පොල් | 15,252.00 |
| | **29,460,013.42** |

සටහන් **06**

වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ

| | | |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 2,174,638.50 | |
| අඩු කළා - බොල් ණය වෙන් කිරීම | 76,765.00 | 2,097,873.50 |
| විවිධ ණයගැතියෝ | 58,616,378.59 | |
| හානි වීම් වලින් වන අලාභ | 671,996.00 | 57,944,382.59 |
| | | **60,042,256.09** |

සටහන් **07**

තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවුම්

| | |
|---|---|
| අත්තිකාරම් | 150,150.00 |
| පෙර ගෙවුම් | 824,990.03 |
| තැන්පතු | 4,485,587.50 |
| | **5,460,727.53** |

සටහන් 08

මුදල් හා මුදල් සමාන දෑ

| | |
|---|---|
| මුදල් - මාර්ගස්ථ | 84,020.90 |
| මුදල් - අත ඉතිරි හා බැංකු ඉතිරි | 66,445,274.39 |
| **එකතුව** | **66,529,295.29** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

### සටහන් 09

**අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුනු ප්‍රදාන**

| | |
|---|---|
| උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය | 7,247,927.86 |
| අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | 1,612,451.80 |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 10,830,630.00 |
| | **19,691,009.66** |

### සටහන් 10

**ප්‍රාග්ධන සංචිත**

| | |
|---|---|
| ප්‍රත්‍යාගණන සංචිතය - වාහන | 21,728,653.03 |
| අනෙකුත් ප්‍රාග්ධන සංචිත | 512,730.22 |
| | **22,241,383.25** |

### සටහන් 11

**ජංගම වගකීම්**

| | |
|---|---|
| විවිධ ණයහිමියෝ | 13,271,524.48 |
| උපචිත වියදම් | 13,577,317.61 |
| **එකතුව** | **26,848,842.09** |

### සටහන් 12

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව හඳුනාගත් පෙර වර්ෂයට අදාල ගැලපීම් හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල අවශ්‍ය වෙනස්කම් සිදු කර ඒ අනුව, 2012 වර්ෂයට අදාල සැසඳීම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කර ඇත.

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

**වාණිජ අංශය**

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම

| **2012.12.31** (රු.) | | **2013.12.31** (රු.) |
|---|---|---|
| | **විකුණුම් / පිරිවැටුම** | |
| 47,224,171.89 | කජු මද | 79,451,283.62 |
| - | බීජ කජු ඇට | - |
| 101,715,050.00 | කජු පැල | 54,306,175.00 |
| 1,168,019.62 | පොල් | 447,484.03 |
| - | ආපසු එවුම් | (24,570.00) |
| **150,107,241.51** | **ශුද්ධ විකුණුම්** | **134,180,372.65** |
| | අඩුකළා: **විකුණුම් පිරිවැය** | |
| 1,804,244.42 | තොග අඩු/ වැඩිවීම | (2,379,414.63) |
| 15,500,764.37 | තවාන් වියදම් | 8,286,338.92 |
| 16,830,913.43 | කජු මද නිෂ්පාදන පිරිවැය / පොදුකාර්ය | 53,777,950.91 |
| 17,805,186.39 | මෙරු පදේශ නඩත්තු වියදම් | 16,005,236.36 |
| 7,997,965.29 | මෙරු පදේශ සෘජු වියදම් | 6,895,925.38 |
| 59,939,073.90 | **මුළු විකුණුම් පිරිවැය** | 82,586,036.94 |
| **90,168,167.61** | දළ ලාභය | **51,594,335.71** |
| | අඩුකලා : **අනෙකුත් වියදම්** | |
| 25,097,195.93 | පරිපාලන වියදම් (පිරිසැකසුම් සහ තවාන්) | 22,076,033.71 |
| 25,097,195.93 | | 22,076,033.71 |
| **65,070,971.68** | **ලාභ (අලාභ) කමක්ෂය කිරීමට පෙර** | **29,518,302.00** |
| 3,714,705.71 | කමක්ෂය | 3,044,757.11 |
| **61,356,265.97** | ලාභ (අලාභ) කමක්ෂය කිරීමට පසු | **26,473,544.89** |
| 96,507.09 | ලාභ / (අලාභ) වයින් | (54,807.78) |
| 87,000.00 | ලාභ / (අලාභ) පිරිසැකසුම් උපකරණ | 95,000.00 |
| (797,479.00) | ලාභ / (අලාභ) සත්ව පාලනය | 247,215.52 |
| **60,742,294.06** | **කියාන්විතයෙන් ලත් ශුද්ධ ලාභ / (අලාභ)** | **26,760,952.63** |
| 2,459,036.87 | අනෙකුත් ආදායම් | - |
| 25,909,934.00 | රාජ්‍ය පදාන පුනරාවර්තන | 22,774,500.00 |
| - | ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය | 2,531,823.00 |
| - | පොලී ආදායම් | 6,668,907.90 |
| - | වෙනත් ආදායම් | 846,271.90 |
| - | කමක්ෂය - වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන | 160,030.74 |
| **28,368,970.87** | මුළු අනෙකුත් ආදායම් | **32,981,533.54** |
| 19,357,697.31 | පරිපාලන වියදම් (පධාන කාර්යාලය) | 21,417,288.22 |
| **69,753,567.62** | ශුද්ධ ලාභය | **38,325,197.95** |

**ශ්‍රී ලංකා කපු සංස්ථාව**
**සේවා අංශය**

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් හා වියදම්

| **2012.12.31** (රු.) | | | (රු.) |
|---|---|---|---|
| | **ආදායම** | | |
| 14,496,036.83 | රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන ප්‍රවර්තන වසර | | 23,032,116.15 |
| 2,394,033.04 | **ක්‍රමක්ෂය** | | 1,852,413.21 |
| 32,670,066.00 | **පුනරාවර්තන** | | 29,725,500.00 |
| **49,560,135.87** | **මුළු ආදායම** | | **54,610,029.36** |
| | **අඩු කළා :** | | |
| | **වියදම්** | | |
| 23,981,642.93 | ප්‍රධාන කාර්යාලය | 27,954,053.91 | |
| 14,496,036.83 | ප්‍රාග්ධන දීමනා යටතේ | 23,032,116.15 | |
| 34,583,060.13 | ව්‍යාප්ති සේවා | 38,027,315.36 | |
| 2,019,132.45 | පර්යේෂණ හා සංවර්ධන | 2,192,343.89 | |
| - | ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 762,504.52 | |
| 75,079,872.34 | **මුළු වියදම** | | 91,968,333.83 |
| **(25,519,736.47)** | වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ වියදම අවසාන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුමට මාරු කලා | | **(37,358,304.47)** |

**ශ්‍රී ලංකා කපු සංස්ථාව**

2013.12.31 දිනෙන් අවසන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම

| **2012.12.31** | | |
|---|---|---|
| 69,753,567.62 | **වානිජ අංශයෙන් ඉපයූ ශුද්ධ ලාභය** | 38,325,197.95 |
| (25,519,736.47) | වර්ෂය තුල ආදායම ඉක්මවූ වියදම- සේවා අංශය | (37,358,304.47) |
| **44,233,831.15** | | **966,893.48** |

ශ්‍රී ලංකා කපු සංස්ථාව

**මුදල් ප්‍රවාහ ප්‍රකාශ**

**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | (රු.) | (රු.) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| වර්ෂය තුල ඉපයූ ශුද්ධ ලාභය | | 966,893.48 |
| මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම් | | |
| ක්ෂය වීම් | 11,974,188.19 | |
| ක්‍රමක්ෂය | 3,044,757.11 | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම | 4,539,710.92 | |
| බොල් ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම | 654,384.00 | |
| ස්ථාවර වත්කම් හුවමාරුවෙන් වූ අලාභය | (293,614.79) | |
| වතුවල අගය ලියා හැරීම | (1,890,821.71) | |
| ප්‍රාග්ධන සංචිත ලියා හැරීම | 1,434,993.00 | |
| ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය | (24,884,529.36) | |
| | | (5,420,932.64) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය / පාඩුව | | (4,454,039.16) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | |
| තොගය - (වැඩිවීම) / අඩුවීම | 16,675,296.23 | |
| ණය ගැතියෝ - (වැඩිවීම) / අඩුවීම | 10,462,327.21 | |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් - (වැඩිවීම) / අඩුවීම | (2,087,135.00) | |
| ණය හිමියෝ - වැඩිවීම / (අඩුවීම) | (5,308,027.01) | |
| උපචිත වියදම් - වැඩිවීම / (අඩුවීම) | (2,026,244.99) | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ - වැඩිවීම / (අඩුවීම) | (3,256,512.00) | |
| | | 14,459,704.44 |
| | | 10,005,665.28 |
| පාරිතෝෂිත ගෙවීම් | | (1,936,514.00) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 8,069,151.28 |

**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (11,232,774.55) | |
| | (215,375.77) | |
| නව වගා සඳහා ආයෝජනය | (9,306,687.14) | |
| ලැබීම් - ස්කන්ධ ප්‍රදාන | 1,780,437.61 | |
| වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය | 88,747.93 | |
| | | (18,885,651.92) |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (10,816,500.64) |

**මූල්‍ය ක්‍රියාකාරම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

| | |
|---|---|
| රාජ්‍ය ප්‍රදාන | 48,670,000.00 |
| වර්ෂය තුලදී මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම | 37,853,499.36 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම | 28,675,795.93 |
| | **66,529,295.29** |

| (සටහන 01) | **2013.01.01** දිනට | **2012.12.31** දිනට |
|---|---|---|
| අත ඉතිරි සහ බැංකු ඉතිරි මුදල් | 28,510,500.82 | 66,445,274.39 |
| මාර්ගස්ථ මුදල් | 165,295.11 | 84,020.90 |
| | **28,675,795.93** | **66,529,295.29** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සදහා ස්කන්ධ වෙනස්වීමේ පකාශය

| වෙනස්වීම් | මූලික පාග්ධනය | රාජ්‍ය පාග්ධන ප්‍රධාන | පාග්ධන පදාන - උතුරු නැගෙනහිර වෙරළබඩ පජා.සං.වැඩසටහන | පාග්ධන පදාන - අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යංශය | පත්‍යාගණන සංචිතය | අනෙකුත් පාග්ධන සංචිත | පදාන සුළු අපනයන භෝග පවර්ධන අමාත්‍යංශය | ලාභා ලාභ ගිණුම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2012.12.31 දිනට ශේෂය | - | 34,959,185.36 | 7,473,939.51 | 1,612,451.80 | 3,099,687,875.76 | 512,730.22 | 8,824,180.74 | 117,787,906.97 | 3,270,858,270.36 |
| රාජ්‍ය ප්‍රධාන ක්‍රමක්ෂය නිවැරදි කිරිම | - | 40,000,000.00 | - | - | - | - | - | (40,000,000.00) | - |
| රාජ්‍ය ප්‍රධාන නැවත වර්ගීකරණය | 40,000,000.00 | (40,000,000.00) | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගනණ සංචිත ගැලපිම. ජ ඉඩම් | 40,000,000.00 | - | - | - | (3,076,524,229.73) | - | - | - | (3,076,524,229.73) |
| 2012.12.31 දිනට ශේෂය | 80,000,000.00 | 34,959,185.36 | 7,473,939.51 | 1,612,451.80 | 23,163,646.03 | 512,730.22 | 8,824,180.74 | 77,787,906.97 | 234,334,040.63 |
| වර්ෂ තුලදී ලද ප්‍රධාන | - | 48,670,000.00 | - | - | - | - | 2,166,480.00 | | 50,836,480.00 |
| ලාභ අලාභ ගිණුමට මාරු කිරිම | - | (24,884,529.36) | (226,011.65) | - | - | - | (160,030.74) | - | (25,270,571.75) |
| වත්කම් ඉවත් කිරිමේ ගිණුමට මාරු කිරිම | - | - | - | - | (1,434,993.00) | - | - | - | (1,434,993.00) |
| වත්කම් ලියා හැරිම තුලින් ලද වන්දි | - | - | - | - | - | - | - | 4,312,539.57 | 4,312,539.57 |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | - | - | - | - | - | (1,728,043.00) | (1,728,043.00) |
| කාල පරිච්චේදය සදහා ශුද්ධ ලාභය | - | - | - | - | - | - | - | 966,893.48 | 966,893.48 |
| 2013.12.31 දිනට ශේෂය | **80,000,000.00** | **58,744,656.00** | **7,247,927.86** | **1,612,451.80** | **21,728,653.03** | **512,730.22** | **10,830,630.00** | **81,339,297.02** | **262,016,345.93** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒඑෆ්(1)/ඒ/එස්එල්සී/01/13/08 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 අගෝස්තු 27 දින

සභාපති,

ශ්‍රී ලංකා කජු සංස්ථාව

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 අප්‍රේල් 21 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 02 — තොග අගය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය යොදා ගත යුතු වුවත්, කජු අලෙවිසැල්වල සම්පූර්ණයෙන් නිමවූ කජු මද තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව විකුණුම් මිළෙන් සියයට 15 ක ලාභ ආන්තිකයක් සහිතව තොග අගය කර තිබුණි. එමෙන්ම පිරිසැකසුම් මධ්‍යස්ථානවල නිමි තොගයේ අගය ඉහත පිරිවැයෙන් සියයට 90 ක් සහ අර්ධ නිමි තොගය නිමි තොගයෙන් සියයට 95 ක් ලෙස සලකා තොග අගය කර තිබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16

(i) ප්‍රත්‍යාගණිත අගයට ප්‍රකාශ කර ඇති වාහන සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය සහ ස්වාධීන තක්සේරුකරුවෙකු යොදා ගත්තේද යන බව හෙළිදරව් කර නොතිබුණි.

(ii) ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් වලින් සියයට 41 ක් නියෝජනය වන පිරිවැය රු: 37,451,944 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් සංස්ථාව විසින් තවදුරටත් පරිහරණය කරමින් පැවතුණි. එම වත්කම් නැවත අගය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19

(i) පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ජීව ගණක තක්සේරුකරුවකු ලවා තක්සේරු කරගනිමින් ජීව ගණක ලාභ පාඩු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) පාරිතෝෂික අරමුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39,32 සහ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 07 — වෙළඳ ණයගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු දෑ, තැන්පතු, අත්තිකාරම් සහ කලින් ගෙවීම්, මුදල් හා මුදල් වලට සමාන වත්කම් සහ වෙළඳ ණයහිමියන් හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලෙස හඳුනා ගැනීම මිනුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ප්‍රමිත ප්‍රකාරව සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 41 — කජු සංස්ථාව සතු ජෛව විද්‍යාත්මක වත්කම් එනම් කජු ගස් මෙම ප්‍රමිතිය ප්‍රකාරව සාධාරණ අගයට ගිණුම්ගත කිරීම හා හෙළිදරව් කිරීම කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් වටිනාකම රු.204,679 ක් වූ කජු මද, නිකුත් කිරීමේ නිවේදන නිකුත් කිරීමකින් තොරව තොග පොත් වලින් ඉවත් කර තිබුණි. මෙම නිකුත් කිරීම් විධිමත් ක්‍රමවේදයක් යොදා ගනිමින් නිකුත් කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයට පෙර සිට පවතින රු:2,003,354 ක් වූ බාහිර ණයගැති ශේෂය 2013 දෙසැම්බර් 31 වන විටත් අය කර ගෙන නොතිබුණි. එහි ඇතුළත් රු:1,962,800 ක් 2009 වර්ෂයේදී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයට පැළ ලබාදීම වෙනුවෙන් ඇති වූ ණය ශේෂයක් වූ අතර 2010 වර්ෂය අවසානය වන විට එම ණය අයකර ගැනීමට එලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බැවින් 2013 දෙසැම්බර් 31 දිනවන විට එම ණය අයකරගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි.

(ආ) වසර කිහිපයක සිට පැවතෙන පහත සඳහන් බැරකම් පියවීමට කටයුතු කර නොතිබුණි.

| ආයතනය | වටිනාකම | කාලය |
|---|---|---|
| | රු. | |
| වී අලෙවි මණ්ඩලය | 3,500,000 | 2005 වර්ෂයේ සිට |
| ගෙවිය යුතු සහනාධාර | 2,429,612 | 2010 වර්ෂයේ සිට |
| අස්වනු රක්ෂණය | 719,466 | 2005 වර්ෂයට පෙර සිට |
| එකතුව | 6,649,078 | |

2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම පිළිබඳ විස්තර |
|---|---|
| I). 2006 අංක 10 දරන දේශිය ආදායම් බදු පනත. | සංස්ථාව ආදායම් බදු බැදියාවට යටත් ආයතනක් වන නමුත් 2011/2012 තක්සේරු වර්ෂය සහ 2012/2013 තක්සේරු වර්ෂයේ ආදායම් බදු ප්‍රකාශන සකස් කිරීමට හෝ ආදායම් බදු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| II). 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | තොග සහ සිල්ලර භාණ්ඩ සපයන, භාණ්ඩවල නිෂ්පාදකයා එම ආයතනයම වන විටදී සහ වාර්ෂික පිරිවැටුම මිලියන 12 කට වැඩි වන විටදී එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී එකතු කළ අගය මත බදු අයකළ යුතු වුවත්, සංස්ථාව විසින් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| III). 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | නිෂ්පාදන කටයුතුවල නියැලෙන කාර්තුවක පිරිවැටුම රු.650,000 ඉක්මවන ආයතන විසින් ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමට බැඳියාවක් ඇති නමුත් සංස්ථාව ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| IV). 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | කාර්තුවක පිරිවැටුම රු.මි. 7.5 ක් ඉක්මවන ආයතන ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු නමුත් සංස්ථාව ආර්ථික සේවා ගාස්තු ගෙවීමට ලියාපදිංචි වී බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| V). 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත | සේවකයින්ට අතිකාල ගෙවීමේදී අතිකාල පැයක රේටය සාප්පු හා කාර්යාල සේවක පනතට අනුව ගණනය කර තිබුණද වැඩ කර තිබූ අතිකාල පැය ගණන් බැලීමේ දී සාප්පු හා කාර්යාල සේවක පනත අදාල කර ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.966,893 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.44,233,831 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසදීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.43,266,938 ක අඩුවීමක් නිරීක්ෂණය විය. කජු පැළ විකුණුම් අදායම රු.47,408,875 කින් පහත වැටීම හා සේවා අංශයේ වියදම් රු.16,888,461 කින් වැඩිවීම මෙම පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

(අ) වාණිජ අංශය

| | වතු සහ අලෙවි අංශය | | | වාණිජ පැළතවාන් අංශය | | |
|---|---|---|---|---|---|---|
| | 2013 රු: | 2012 රු: | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම/ (අඩුවීම) | 2013 රු: | 2012 රු: | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම/ (අඩුවීම) |
| මුළු ආදායම | 85,411,920 | 57,375,124 | 49 | 54,307,276 | 101,947,112 | (47) |
| මුළු වියදම් | 91,462,288 | 61,367,823 | 49 | 20,728,222 | 36,115,643 | (43) |
| මෙහෙයුම් ලාභය/ අලාභය | (6,050,368) | 3,992,699) | 51.5 | 33,579,054 | 65,831,469 | (49) |
| ලාභාන්තිකය සියයට | (7) | (6.5) | | 162 | 182 | |

(ආ) සේවා අංශය

| | 2013 රු: | 2012 රු: | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම (අඩුවීම ) |
|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 25,044,560 | 16,890,069 | 48 |
| පුනරාවර්තන | 52,500,000 | 58,580,000 | (10) |
| වාණිජ අංශයේ ලාභ | 27,528,686 | 61,838,770 | (55) |
| පොලී ආදායම | 6,668,908 | - | - |
| වත්කම් ඉවත්කිරීමේ ලාභය | 2,531,823 | - | - |
| වෙනත් ආදායම් | 78,538 | 1,362,562 | (94) |
| මුළු ආදායම | 114,352,515 | 138,671,401 | (17.5) |
| සේවා අංශයේ මුළු වියදම | 113,385,622 | 94,437,570 | 20 |
| ලාභය | 966,893 | 44,233,831 | |

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වතු සහ අලෙවි අංශයේ මෙහෙයුම් අලාභය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 51.5කින් වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි බිජ කජු පැළයක සහ බද්ධ කජු පැළයක පිරිවැය පිළිවලින් රු: 27.50 ක් සහ රු: 39 ක් වු අතර විකුණුම් මිළ පිළිවලින් රු: 100 ක් හා රු:200 ක් වුයෙන් වාණිජ පැළතාවාන් අංශයේ සියයට 162 ක ඉහළ ලාභාන්තිකයක් ළගාකරගෙන තිබුණි.

(ඇ) දිවිනැගුම වැඩසටහනට කජු පැළ නිකුත් කිරීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට කජු පැළ අලෙවි ආදායම් සීඝ්‍ර ලෙස වැඩි වී තිබුණු නමුත් 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කජු පැළ ආදායම සියයට 47 කින් අඩුවී තිබුණි.

(ඈ) පිරිසැකසුම් මධ්‍යස්ථානවල නිෂ්පාදන පිරිවැය 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදි සියයට 219 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කජු මද නිෂ්පාදනය වැඩිවීම සහ රු:12,891,411 ක් වටිනා කජු මද කිලෝග්‍රෑම් 7000 ක් පමණ බාහිර පාර්ශවයන්ගේ මිලදී ගැනිම ආදිය මීට හේතුවී තිබුණි.

### 3.2.1 මුල්‍ය ව්‍යුහය

මුල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මුල්‍ය ව්‍යුහය 2012 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

| සම්පත් | දෙසැම්බර් 31 දිනට තත්ත්වය | | | |
|---|---|---|---|---|
| | 2013 | ප්‍රතිශතය | 2012 | ප්‍රතිශතය |
| | රු. | | රු. | |
| ප්‍රාග්ධනය | 40,000,000 | 15 | 40,000,000 | 17 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 58,744,656 | 23 | 34,959,185 | 15 |
| වෙනත් ආයතන ප්‍රදාන | 19,691,010 | 08 | 17,910,572 | 08 |
| ප්‍රාග්ධන සංචිත | 22,241,383 | 09 | 23,676,376 | 10 |
| දිගුකාලීන වගකීම් | 37,131,463 | 14 | 37,784,779 | 16 |
| ඉ/ ලාභ අලාභ | 81,339,297 | 31 | 77,787,907 | 34 |
| | 259,147,809 | 100. | 232,118,819 | 100 |

උපයෝජන

| | | | | |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 64,131,331 | 25 | 64,986,142 | 28 |
| වගා ඉඩම් සඳහා වූ වියදම් | 60,373,028 | 23 | 52,309,024 | 22 |
| ශුද්ධ ජංගම වත්කම් | 134,643,450 | 52 | 114,823,653 | 50 |
| | 259,147,809 | 100 | 232,118,819 | 100 |

පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන සියයට අටකින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) සංස්ථාව සතු කජු වතුවල නිෂ්පාදනය හා නිෂ්පාදන පිරිවැය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| වතුයාය | නිෂ්පාදනය කජු ගෙඩි (කි. ග්‍රෑ) | නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ.ඒකක පිරිවැය | මේරූ කජු ප්‍රදේශ හෙක්ටයාර් | නොමේරූ කජු ප්‍රදේශ හෙක්ටයාර් | වයස් මට්ටම් මේරූ අවු. | වයස් මට්ටම් නොමේරූ අවු. |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | | | | |
| පුත්තලම | 15,882 | 9,437,857 | 594 | 191.04 | 110.3 | 30 ට වැඩි | 5 ට අඩු |
| කමන්දළුව | 28,542 | 7,728,507 | 271 | 129 | 37 | 30 ට වැඩි | 5 ට අඩු |
| එළුවන්කුලම | 18,730 | 5,371,016 | 287 | 72.5 | 10.5 | 11 ට වැඩි | 5 ට අඩු |
| හාඩි | 4,238 | 1,495,051 | 353 | 70.85 | 10.12 | 30 ට වැඩි | 5 ට අඩු |
| නාලන්දා | 2,782 | 1,082,281 | 389 | 20.24 | 8.1 | 10 ට වැඩි | 5 ට අඩු |
| විලච්චිය | 483 | 185,210 | 383 | - | 7.29 | - | 5 ට අඩු |
| මහඔය | 196.7 | - | | - | 10.12 | - | 5 ට අඩු |
| මිරිජ්ජවිල | 112.6 | - | | - | 40.49 | - | 5 ට අඩු |
| එකතුව | 70,966.3 | | | 483.63 | 233.92 | | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(i) සංස්ථාව සතු ඵලදරන හෙක්ටයාර් 484 ක් අතුරින් සියයට 81 වු හෙක්ටයාර් 391 ක් අවු: 30 ට වැඩි ඵලදායි ජීව ආයුකාලය පසුකර තිබුණි.

(ii) කජු ගෙඩි කි.ග්‍රෑ. 1 ක වෙළඳපොළ වටිනාකම රු.225 ක් පමණ වන අතර පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම, හාඬි, නාලන්දා, මහවිලච්චිය වතුවල කජු ගෙඩි කි.ග්‍රෑ. 1 නිෂ්පාදන පිරිවැය වෙළඳපොළ වටිනාකම ඉක්මවා තිබුණි.

(ආ) සහනාධාර වැඩසටහන

කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයේ කජු සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණනයේදි නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

| | දිස්ත්‍රික්කය | ගොවීන් සංඛ්‍යාව | අක්කර ප්‍රමාණය | ලබාදුන් පැළ ප්‍රමාණය | 2013 වර්ෂයේ නිරීක්ෂණය වු සාර්ථක කජු පැළ ප්‍රමාණය | ප්‍රගතිය (ලබා දුන් පැළ ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|---|
| 2010 | පුත්තලම | 372 | 564 | 45,120 | 8914 | 22.8 |
| | කුරුණෑගල | 508 | 600 | 48,000 | 12,352 | |
| 2011 | පුත්තලම | 314 | 600 | 48,000 | 11,905 | 28.7 |
| | කුරුණෑගල | 383 | 500 | 40,000 | 13,362 | |

සහනාධාර වැඩසටහන යටතේ ගොවීන් අතර බෙදා දී තිබු කජු පැළවලින් සාර්ථකව වැවී තිබුණු පැළ ප්‍රමාණය 2010 වර්ෂයේ සියයට 22.8 ක්ද 2011 වර්ෂයේ සියයට 28.7 ක්ද තරම් අඩුමට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් වතුවල මුළු ආදායමට සාපෙක්ෂව සෘජු හා පරිපාලන වියදම් වැඩිවීම හේතුවෙන් එම වතු මෙහෙයුම් අලාභයක් ලබා තිබුණි.

| අංශය | ආදායම | නිෂ්පාදන වියදම | මෙහෙයුම් අලාභය |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| පුත්තලම වතුයාය | 4,259,421 | 9,459,727 | 5,200,306 |
| කමන්දළුව වතුයාය | 7,845,919 | 8,233,640 | 387,721 |
| එළුවන්කුලම වතුයාය | 4,680,723 | 5,422,046 | 741,323 |
| නාලන්දා වතුයාය | 859,106 | 1,286,266 | 427,160 |
| හාඩි වතුයාය | 1,534,199 | 1,875,950 | 341,751 |
| එකතුව | | | 7,098,261 |

(ආ) සංස්ථාව විසින් අළුතින් ආරම්භ කරන ලද වයින් නිෂ්පාදන ව්‍යාපෘතියේ ආදායම රු: 234,150 ක් වූ අතර වියදම රු: 288,958 ක් වුයෙන් මෙහෙයුම් අලාභය රු:54,808 ක් විය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ ඉහළ කළමනාකරණ තනතුරුවල පුරප්පාඩු 01 ක් පැවතුණු අතර විධායක සහ විධායක නොවන ශ්‍රේණි වල පුරප්පාඩු 24 ක්ද සුළු සේවක පුරප්පාඩු 12 ක්ද වශයෙන් අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 37 පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 මාර්තු 31 දිනවන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරන ලද සංස්ථාවට අයිතිය නොමැති කජු ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීම යන ගැටළුව 2014 මාර්තු 31 දක්වාම නිවැරදි වී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ආපසු ලැබෙන කජු භාරගැනීම.

(ආ) කජු තොග ගබඩා කිරීම.

(ඇ) නොමිලේ කජු නිකුත් කිරීම.

(ඈ) කජු සඳහා වියළි බර ඉඩ දීම සහ සම්මත අපතේයෑම.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව නිකුත්කළ විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදහස් දැක්වීම හා ගනු ලබන ක්‍රියාමාර්ග දැනුම්දීම.

2.2.1 (අ) සංස්ථාවේ පිරිවැය කමවේදයන් මත සිදුකර ඇති ගණනය කිරීම්වලට අනුව හා කජු මද විකුණුම් මත තබා ගන්නා ලාභ පතිශතය අනුව සම්පූර්ණයෙන් නිමවූ කජු මද හා අර්ධ වශයෙන් නිමවූ කජු මදවල පිරිවැය නියමිත ආකාරයෙන් ගණනය කර ඇත.

ඒ අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය වූ පිරිවැය මත කජු මද තොග අගය කර ඇත.

2.2.1 (ආ) (i) මෙම සංස්ථාවේ වාහන පත්‍යාගණනය කිරීමේ කටයුතු සුදුසුකම්ලත් රජයේ යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගෙන් ද සමන්විත කමිටුවක් මඟින් සිදුකර ඇති අතර, පත්‍යාගණනය ක්‍රියාත්මක කළ දිනය වන්නේ 2009.01.01 දිනයයි. මීට අදාල හෙළිදරව් කිරීම් මූල්‍ය පකාශවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ආ)(ii) අදාල ගිණුම්කරණ පමිතීන්ට අනුව කිසියම් ස්ථාවර වත්කම් වර්ගයක් යටතේ අන්තර්ගතව පවතින ස්ථාවර වත්කම් සංඛ්‍යාවෙන් කොටසක් පමණක් පත්‍යාගණනයට භාජනය කර ඒවා ගිණුම් පොත්වල වාර්තා කිරීමට නොහැකි අතර, අදාල ස්ථාවර වත්කම් වර්ගය යටතේ පවතින සියළු ස්ථාවර වත්කම් එකවර පත්‍යාගණනයට භාජනය කළ යුතුය.

සංස්ථාව සතුව බාහිර කාර්යාල විශාල සංඛ්‍යාවක් පවතින අතර, පධාන කාර්යාලයේ ද ඇතුළුව එම බාහිර කාර්යාලවල යන්ත උපකරණ, ලී බඩු උපකරණ හා සවිකිරීම් සහ අනෙකුත් උපකරණ ඉතා විශාල සංඛ්‍යාවක් භාවිතයේ පවතින බැවින් ඒවා සියල්ලම එකවර පත්‍යාගණනයට භාජනය කිරීම ඉතා අපහසු වේ.

කෙසෙ නමුත් පමාණවත් මුල්‍ය පතිපාදන ලද වහාම අදාල ස්ථාවර වත්කම් පත්‍යාගණනයකට භාජනය කර එහි පතිඵල ගිණුම් පොත්වල දැක්වීමට කටයුතු කරනු ඇත.

2.2.1 (ඇ) (i) 2013 වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම් තක්සේරු කර ගැනීම සඳහා සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකු ඉතා අපහසුවෙන් සම්බන්ධ කරගත් අතර, අදාල කාර්යය සිදුකිරීමට පෙර ඒ සඳහා එම තක්සේරුකරුගෙන් අදාල වෘත්තීය ගාස්තු සම්බන්ධයෙන් මිල ගණන් කැඳවූ අතර, ඉදිරිපත් වූ වෘත්තීය ගාස්තු වටිනාකම ඉතා ඉහළ අගයක් ගත් නිසාත්, ඒ සඳහා මුදල් පතිපාදන සංස්ථාව සතුව නොමැති නිසාත් වෙනයම් සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකු සම්බන්ධ කරගත නොහැකි වූ නිසාත් අපගේ දැනුම හා පළපුරුද්ද අනුව පාරිතෝෂික වෙන්කිරීම් සඳහා පායෝගිකව ගැලපෙන සෙ වටිනාකම් ආදේශනය කර එය ගිණුම් පොත්වලට ගැලපීම සිදුකරන ලදී.

2.2.1 (ඇ) (ii) පාරිතෝෂික වෙන්කිරීම් සම්බන්ධයෙන් සංස්ථාවේ ගිණුම්පොත්වලට ඇතුලත් කරනු ලබන්නේ පොත් සටහනක් පමණක් වන අතර, එසෙ වෙන්කරන ලද පාරිතෝෂික වටිනාකම් ගෙවනු ලබන්නේ රජයේ මුදල් පතිපාදනවලිනි, එම මුදල් ද සංස්ථාව වෙත ලැබෙන්නේ වරින්වරයි. මෙම තත්ත්වය අනුව ආයෝජනය කිරීම සඳහා පාරිතෝෂික අරමුදලක් මුදල්වලින් එක්රැස් නොවේ.

2.2.1 (ඇ) පවර්තන වර්ෂයේදී මේ සම්බන්ධයෙන් අදාල වන හෙළිදරව් කිරීම් මුල්‍ය පකාශවල සිදුකරනු ඇත.

2.2.1 (ඉ) සංස්ථාව සතු ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ අගය මැනීම සඳහා පමාණවත් තාක්ෂණික දැනුමක් අප සතුව නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේදී එම කාර්යය සඳහා විශෙෂඥ දැනුමක් ඇති තක්සේරුකරුවන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ ද එම උත්සාහය ව්‍යර්ථ විය. කෙසෙ නමුත් 2014 වර්ෂයේදී පවතින මුදල් පතිපාදන සම්බන්ධයෙන් ද සලකා බලා මෙම කාර්යය සිදුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ඇත.

2.2.2 මෙම නිමි කජු මද තොග නොමිලේ නිකුත් කර ඇත්තේ විකුණුම් පවර්ධන කටයුතු සඳහා වන අතර, එලෙස නොමිලේ නිකුත් කරන ලද කජු මදවල වටිනාකම 2013 වර්ෂයේ සංස්ථාවේ සමස්ත කජු මද විකුණුම් වටිනාකමෙන් 0.2% කට ආසන්න වන ඉතා පහළ පතිශතයකින් යුක්ත වේ.

මෙම සියලූ කජු මද නොමිලේ නිකුත් කිරීම් අදාල බින් කාඩ්පතවලට ඇතුලත් කර ඇති අතර, ඒ අනුව ඒවා නිමි කජු තොගවලට අදාල පරිදි ගලපා ඇත.

ඉහත සඳහන් විකුණුම් පවර්ධන කාර්යය සඳහා නොමිලේ නිකුත් කරන ලද කජු මදවල වටිනාකම අතපසුවීමකින් ගිණුම්පොත්වලට ඇතුලත් කිරීමට නොහැකි වී ඇති අතර, කෙසෙ නමුත් එමගින් මුල්‍ය පකාශනයන් හි පෙන්නුම් කරන පතිඵලයන්ට කිසිදු බලපෑමක් එල්ල වී නොමැත.

කෙසෙ නමුත් කජු මද නොමිලේ නිකුත් කිරීම්වල විධිමත්භාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කර ඇත.

2.2.3 (අ) මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති රු. 2,003,354/= ක බාහිර ණයගැති වටිනාකමෙන් 98% කට ආසන්න වටිනාකමක් (රු. 1,962,800/=) යුක්ත වන්නේ ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය හා ඒකාබද්ධව සමෘද්ධි සංවර්ධන අධිකාරිය සමඟ සංස්ථාව විසින් සිදු කරන ලද වගා ව්‍යාපෘතියක් සඳහා සංස්ථාව මඟින් සැපයූ බද්ධ කජු පැළ සඳහා අනුපාප්තිකයෙකු ද නොමැතිව දැනට වසර ගණනාවකට පෙර වසා දමා ඇති ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ණය වටිනාකමයි. මෙම තත්ත්වය යටතේ අදාල ණය මුදල අයකරවා ගැනීමට කමයක් නොමැත. අවශ්‍ය අනුමැතීන් ලබා ගනිමින් මෙම ණය මුදල ගිණුම් පොත්වලින් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.2.3 (ආ) මෙහි සඳහන් ගෙවිය යුතු ගිණුම් ලෙස සඳහන් වී අලෙවි මණ්ඩලය සඳහා ගෙවිය යුතු වටිනාකම සඳහා සහ සහනාධාර වටිනාකම සඳහා සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් මුදල් පතිපාදන ලැබෙන ආකාරය අනුව ඉදිරියේදී ගෙවීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.

අස්වනු රක්ෂණය යටතේ සඳහන් ගෙවිය යුතු වටිනාකම බොහෝ ලෙසින් කල් ඉකුත් වූ අගයක් වන බැවින් ද, ගෙවීම් පතිලාභීන් පිළිබඳ වර්තමාන තොරතුරු සපයා ගැනීම දුෂ්කර බැවින් ද ඉදිරියේදී අදාල අනුමැතීන් ලබා ගනිමින් එම වටිනාකම වගකීම්වලින් බැහැර කිරීමට අවශ්‍ය සටහන් ගිණුම් පොත්වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.4(i)සිට(iv)මෙම විගණන විමසුමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාලනාධිකාරියේ අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව මෙහි සඳහන් ආදායම් බදු, එකතු කළ වටිනාකම් මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සෙවා ගාස්තු යන රජයට ගෙවිය යුතු බදු වර්ග කප්‍රු ව්‍යාප්ති සෙවා සපයන රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවට අදාල වන්නාවූ ආකාරය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.2.4 (v) මෙම සංස්ථාව ආරම්භ කළ 1973 වර්ෂයේ සිට මේ දක්වාම සංස්ථාවේ කාර්ය මණ්ඩලය සඳහා අතිකාල ගෙවීමේදී මෙපරිද්දෙන් කටයුතු කර ඇති බව සඳහන් කරමි. කෙසෙ නමුත් මේ සම්බන්ධයෙන් සිදුකළ යුතු වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කර අවශ්‍යතාවය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.1 (අ) (i) සංස්ථාවේ වතුයායන් හි නව වගාවන් සිදුකිරීමට සංස්ථාව වෙත ලැබෙන භාණ්ඩාගාර පතිපාදන ඉතා සීමාසහිත වේ. මේ අනුව නව වගාවන් ඉතා සුළු වශයෙන් සිදුකිරීමට සිදුවී ඇත. කෙසෙ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ වතුයායන් හි අක්කර 660 ක නව කප්‍රු වගාවන් සිදුකර ඇත.

4.1 (අ) (ii) සමාලෝචිත වර්ෂයේදී කප්‍රු අස්වනු සමයේදී සමස්ත දිවයිනටම පොදුවේ බලපෑ සංස්ථාවට පාලනය කළ නොහැකි අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන් හේතු කොටගෙන අපේක්ෂිත කප්‍රු අස්වනු පමාණය බොහෝ සෙයින් අඩුවිය.

වතුයායන් හි වියදම්වලින් ඉතා වැඩි කොටසක් අස්වනු සමයට පෙර වැය කරන කජු අස්වනු එක්රැස්කරගැනීම් ඉලක්ක කර ගනිමින් සිදුකරන වැයකිරීම් වන බැවින් ඉහත පරිදි සංස්ථාවට පාලනය කළ නොහැකි කාලගුණික හා දේශගුණික තත්ත්වයන් අනුව අනපේක්ෂිත ආකාරයෙන් සිදුවන කජු අස්වනු අඩුවීම් හේතු කොටගෙන කජු කිලෝවක නිෂ්පාදන පිරිවැය එහි වෙළෙඳපොල මිල ඉක්මවා යෑම වලක්වාලිය නොහැකි තත්ත්වයකි.

4.1 (ආ) බද්ධ කජු වගාව සඳහා සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2000 වර්ෂයේදී වන අතර, ඉඩම් අක්කර 01 ක වගාවක් සඳහා රු. 9,500/= ක සහනාධාර මුදලක් ඒ යටතේ අදාල ප්‍රතිලාභීන්ට හිමි විය. මේ වනවිට මෙම සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කර වසර 14 ක් ගතව ඇතත් සහනාධාර මුදලෙහි කිසිදු වැඩිවීමක් සිදුවී නොමැත.

මෙම තත්ත්වය මත විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතියේ ඉලක්කගත ප්‍රතිලාභීන් වන අධික දිළිඳුභාවයෙන් පෙළෙන ගොවීන්ට සිය වගාවන් නිසි පරිදි නඩත්තු කිරීම ගැටළුසහගත වී ඇති බැවින් සමස්ථ වගාවන් හි සාර්ථකත්වය අඩුවීමට එය තදින්ම බලපා ඇත.

මීට පිළියමක් වශයෙන් වගා අක්කරයක සහනාධාර මුදල රු. 25,000/= ක් දක්වා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් කිහිපවරක් අනුමැතිය ඉල්ලා ඇතත් මෙතෙක් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත.

කජු වගාවට උචිත වියළි කලාපයේ ඉඩම්වල වගා කරනු ලබන අනෙකුත් ප්‍රධාන ආර්ථික භෝග වන පොල්, උක් වැනි වගාවන් සඳහා දෙනු ලබන සහනාධාර මුදල් කජු වගාව සඳහා ලබාදෙනු ලබන සහනාධාර මුදලට සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබේ. මෙම තත්ත්වය මත ගොවීන් කජු වගාව පිළිබඳව දක්වන උනන්දුව අඩු වී ඇත.

කජු වගාවන් හි සාර්ථකභාවය රැක ගැනීමට අදාල පරිදි ගොවීන් දැනුවත් කරමින් සංස්ථා ක්ෂේත්‍ර නිලධාරීන් සිය උපරිම ශක්ති ප්‍රමාණයෙන් කටයුතු

කළ ද ඉහත සඳහන් පරිදි ඒ සම්බන්ධයෙන් ගොවීන්ගේ උනන්දුව හීනවී යාම වගා සාර්ථකත්වය අඩුවීම කෙරෙහි දැඩිව බලපා ඇත.

එසෙම සහනාධාර වගා ව්‍යාපෘතිය යටතේ කජු පැළ සිටුවීම සිදුකරනු ලබන්නේ මහ කන්නයේ වර්ෂාවත් සමඟ වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල වකවානුව තුල වේ. සාමාන්‍යයෙන් මෙම කාලය තුල මිලිමීටර් 1000 ක පමණ වර්ෂාපතනයක් අපේක්ෂා කරන අතර, 2011 හා 2013 යන වර්ෂවලදී පුත්තලම දිස්ත්‍රික්කයට එම අපේක්ෂිත වර්ෂාපතනය ලැබී නොමැති බව වර්ෂාපතන දත්ත අනුව තහවුරු වේ. ඒ අනුව පිළිවෙලින් 2011 වර්ෂයේදී මිලිමීටර් 423.5 ක වර්ෂාපතනයක් ද, 2013 වර්ෂයේදී මිලිමීටර් 374.3 ක වර්ෂාපතනයක් ද පුත්තලම දිස්ත්‍රික්කයට ලැබී ඇත. මෙම තත්ත්වය ද වගාවන් අසාර්ථක වීමට ද්‍රව්‍යාත්මක ලෙස බලපා ඇත.

මෙම තත්ත්වයට පිළියම් වශයෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ මූල්‍ය පතිපාදන මත ගොවි පුහුණු වැඩසටහන් පැවැත්වීම. සංස්ථාවේ පර්යේෂණ අංශය මඟින් හඳුනාගත් ගොවි ගැටළු සඳහා විසඳුම් ලබාදීම හා නවීන තාක්ෂණික උපදෙස් ගොවීන් වෙත ලබාදීම වැනි කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. තව ද පසුගිය “දැයට කිරුළ” ජංගම සෙවා තුලින් ද අදාල පරිදි ගොවීන් දැනුවත් කිරීමේ කටයුතු ගාමීය මට්ටමින් සිදුකිරීමට කටයුතු කර ඇත.

එසෙම 2013 වර්ෂය හා අදාලව කජු ව්‍යාප්ති සහනාධාර වැඩසටහන යටතේ ගෙවිය යුතුව තිබෙන පළමු සහනාධාර වාරිකය ගෙවීම වෙනුවට අදාල ගොවීන්ගේ වගාවන්වල තත්ත්වය අනුව උපරිමය දක්වා පාලූ සිටුවීම සඳහා කජු පැළ ඔවුන් වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

ඉහත කමවේදය අනුගමනය කිරීම තුලින් ගොවීන් සතු කජු වගා ඉඩම්වල සාර්ථක කජු පැළ පමාණය 75% කටත් වඩා වැඩි පතිශතයකින් යුක්තව පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

4.2 (අ) සමාලෝචිත වර්ෂයේදී කජු අස්වනු සමයේදී සමස්ත දිවයිනටම පොදුවේ බලපෑ සංස්ථාවට පාලනය කළ නොහැකි අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන් හේතු කොටගෙන අපේක්ෂිත කජු අස්වනු පමාණය බොහෝ සෙයින් අඩුවූ බැවින් වතුයායන්ගේ මෙහෙයුම් අලාභයන් උද්ගත විය.

4.2 (ආ) සංස්ථාවේ වයින් නිෂ්පාදන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද්දේ සමාලෝචිත වර්ෂයේ (එනම් 2013 වර්ෂයේ) මැද භාගයේදීය. සමාලෝචිත වර්ෂයේදී වයින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දරන ලද එහෙත වර්ෂය අවසානයේ නොවිකුණා ඉතිරි වී ඇති වයින් තොගයේ පිරිවැයට ඇතුලත් කළ නොහැකි නිෂ්පාදන නොවන වියදම්වල වටිනාකම ඉහළ අගයක් ගත් බැවින් ද ඉලක්කගත ආකාරයෙන් වයින් නිෂ්පාදන කටයුතු නිමකර වයින් බෝතල් අලෙවිය 2013 වර්ෂය අග භාගයේදී ආරම්භ කළ බැවින් ද, වියදම හා වාසිදායක ලෙස සැසඳිය හැකි වයින් අලෙවි ආදායමක් එම වර්ෂයේදී උපයා ගැනීමට නොහැකි වූ හෙයින් වයින් ව්‍යාපෘතියේ කටයුතු මඟින් සුළු අලාභයක් නිර්මාණය විය.

කෙසෙ නමුත් පවර්තන වර්ෂය ආරම්භයේ සිටම වයින් අලෙවි කටයුතු පමාණාත්මක ලෙස සිදුවන බැවින් ද පවර්තන වර්ෂයේ නිෂ්පාදන නොවන වියදම් සාපේක්ෂව අඩු මට්ටමක පවතින බැවින් ද ඉදිරියේදී වයින් ව්‍යාපෘතිය ලාභදායී ලෙස පවත්වාගෙන යෑමේ හැකියාව පවතී.

4.3 වර්තමානයේ සංස්ථාවේ රාජකාරි කටයුතු සඳහා පවතින අවශ්‍යතාවය පරිදි ඉදිරියේදී මෙම සෙවක පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

5.1 මේ වනවිට සංස්ථාවේ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශය වෙත යවා ඇත.

5.2 මෙහි සඳහන් ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙල අනුව මෙම කටයුත්ත සම්පූර්ණ කර

ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගතවන අතර, ඒ අනුව රේබිය අමාත්‍යාංශය හා එක්ව මේ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

6. (අ)සිට(ඈ)ඉදිරියේදී මෙම පාලන ක්ෂේතයන් පිළිබඳ විශෙෂ අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා කපු සංස්ථාව

වර්ෂ 05 ක ගිණුම් සාරාංශය

| ලාභ ලාභ ගිණුම | 2013 (රු.) | 2012 (රු.) | 2011 (රු.) | 2010 (රු.) | 2009 (රු.) |
|---|---|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 134,180 | 150,107 | 117,750 | 71,171 | 64,678 |
| විකුණුම් පිරිවැය | (82,586) | (59,939) | (58,707) | (50,135) | (42,200) |
| **දළ ලාභය** | **51,594** | **90,168** | **59,043** | **21,036** | **22,478** |
| අනෙකුත් ආදායම් | 10,494 | 1,846 | 2,947 | 1,301 | 1,829 |
| පුනරාවර්තන පදාන | 22,775 | 25,910 | 22,403 | 16,959 | 42,500 |
| පරිපාලන වියදම් | (43,493) | (44,455) | (35,383) | (29,403) | (18,072) |
| කමක්ෂය | (3,045) | (3,715) | (3,491) | (3,590) | (3,428) |
| **වාණිජ කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය** | **38,325** | **69,754** | **45,519** | **6,303** | **45,307** |
| **සෙවා අංශය - ආදායම් ඉක්මවූ වියදම්** | **(37,358)** | **(25,520)** | **(25,070)** | **(21,358)** | **(57,066)** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **967** | **44,234** | **20,449** | **(15,055)** | **(11,759)** |
| **ශෙෂ පතය** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 63,916 | 64,986 | 4,509,794 | 4,506,381 | 70,232 |
| මේරූ පදේශ නඩත්තුව | 30,466 | 31,620 | 66,480 | 67,803 | 71,401 |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් | 215 | - | - | - | 385 |
| නොමේරූ පදේශ නඩත්තුව | 29,288 | 19,982 | 40,559 | 41,039 | 38,325 |
| අනෙකුත් කුඩා ව්‍යාපෘති | 619 | 707 | 739 | 807 | 609 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **124,504** | **117,295** | **4,617,572** | **4,616,030** | **180,952** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 29,460 | 46,135 | 37,706 | 25,102 | 30,688 |
| වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 60,042 | 70,822 | 7,744 | 10,916 | 14,996 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 5,461 | 3,374 | 2,464 | 2,480 | 1,456 |
| මුදල් හා මුදල් සමාන දෑ | 66,529 | 28,676 | 45,787 | 5,864 | 13,619 |
| **මුළු ජංගම වත්කම්** | **161,492** | **149,007** | **93,701** | **44,362** | **60,759** |
| **මුළු වත්කම්** | **285,996** | **266,302** | **4,711,273** | **4,660,392** | **241,711** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| මූලික පාග්ධනය | 40,000 | 40,000 | - | - | - |
| රාජ්‍ය පදාන | 58,745 | 34,959 | 258,822 | 251,952 | 244,032 |
| අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු පදාන | 19,691 | 17,911 | 13,570 | 13,570 | 13,570 |
| පාග්ධන සංචිත | 22,241 | 23,676 | 4,464,179 | 4,464,178 | 23,676 |
| ලාභාලාභා ගිණුම | 81,339 | 77,788 | (88,803) | (109,252) | (101,552) |
| **මුළු හිමිකම්** | **222,016** | **194,334** | **4,647,768** | **4,620,448** | **179,726** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම් | 33,875 | 31,272 | 27,835 | 24,451 | 22,911 |
| වාහන කල්බදු | 3,257 | 6,513 | - | - | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | **37,132** | **37,785** | **27,835** | **24,451** | **22,911** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 26,849 | 34,183 | 35,670 | 15,492 | 39,075 |
| **මුළු ජංගම වගකීම්** | **26,849** | **34,183** | **35,670** | **15,492** | **39,075** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | **285,997** | **266,302** | **4,711,273** | **4,660,391** | **241,712** |
| ශුද්ධ වත්කම් පතිලාභය % | 0.44 | 22.76 | 0.44 | (0.33) | (6.54) |
| ශුද්ධ ලාභ අනුපාතය % | 0.7 | 29.5 | 17.4 | (21.2) | (18.2) |
| ජංගම අනුපාතය | 6.0 | 4.4 | 2.6 | 2.9 | 1.6 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 4.9 | 3.0 | 1.6 | 1.2 | 0.8 |
| මුළු ආදායමට මුළු වියදම | 1.0 | 1.6 | 1.2 | (0.9) | 0.9 |